2025

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

Annual Performance Report













සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம்

Department of Animal Production and Health

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2025

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம

Department of Animal Production and Health

Peradeniya

SriLanka

Tel: 94-081-2388337/2388462

Fax: 94-081-2388619

Web Site: www.daph.gov.lk

පටුන

පිටු අංකය

1. ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම 01
1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 01
1.3. ප්‍රධාන කාර්යයන් 02
1.4. සංවිධාන සටහන 04
1.5. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 06
1.6. දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ යටතේ පවතින ආයතන 06
1.7. විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 06

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. 2025 වර්ෂය තුළදී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන්හි මූල්‍ය ප්‍රගතිය 07
2.2. 2025 වර්ෂය තුළදී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන්ගේ මූල්‍ය ප්‍රගතිය 08
2.3. පශු සම්පත් සංවර්ධනය උදෙසා 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘතීන්හි විස්තරාත්මක ප්‍රගතිය 09
2.4. පශු සම්පත් සංවර්ධනය උදෙසා 2026 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් සහ ව්‍යාපෘති 17
2.5. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් 2026 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද නව ව්‍යාපෘති යෝජනා 19

3. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 20
3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 21
3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 22
3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් 23
3.5. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 24
3.6. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 25
3.7. විගණකාධිපතිවරයාගේ වාර්තාව 26

4. කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 35

5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 35
5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 36

6. මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 37
6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය/අතිරික්තය බලපා ඇති ආකාරය 37
6.3. මානව සම්පත් සංවර්ධනය 39

7. අනුකූලතා වාර්තාව 42

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය - 292

1. ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

1978 වර්ෂයේදී ස්ථාපිත කරනු ලැබූ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධනය පිළිබඳව වගකීම දරණ ප්‍රධාන රජයේ ආයතනය වන අතර එය කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. එමෙන්ම මෙම දෙපාර්තමේන්තුව රට තුළ සත්ත්ව රෝග පැතිරීම වළක්වාලීම, මැඩපැවැත්වීම, පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු, තාක්ෂණික නායකත්වය සැපයීම සහ සත්ත්ව අභිජනන කටයුතු සඳහා විශේෂඥ උපදෙස් හා සහාය සේවාවන් සැපයීම සම්බන්ධව නීත්‍යානුකූල බලය පැවරී ඇති ජාතික ආයතනයද වේ. මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකරනු ලබන වෙනත් ප්‍රධාන කටයුතු අතර සත්ත්ව පාලනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම, එම කර්මාන්තය නගාසිටුවීමට අදාළ ව්‍යාපෘති සැකසීම, ආර්ථික ඇගයීම් සහ විශේෂ සංවර්ධන වැඩසටහන්ද ඇතුළත්වේ. පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් අදාළ නීති සම්පාදනය කර ක්‍රියාත්මක කරනු ලැබේ. පළාත් සභා පිහිටුවීමත් සමඟ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර මට්ටමේ කටයුතු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු නවය (09) වෙනට පැවරිණි.

ජාතික සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණ නායකත්වය, විශේෂඥ සේවා සහ සහාය සේවා, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙත ලබාදීමෙන් පශු සම්පත් ක්ෂේත්‍රය වෙනුවෙන් විශාල මෙහෙයක් ඉටුකරනු ලබයි. පශු වෛද්‍ය නිලධාරීන් විසින් මෙහෙයවනු ලබන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකකයන්ය. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම පාහේ පිහිටුවා තිබෙන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල 337 මගින් බිම් මට්ටමේ සිට සියළුම පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.2.1. දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා පශු සම්පත් ක්ෂේත්‍රය මෙහෙයවන ප්‍රමුඛතම ආයතනය වීම.

1.2.2. මෙහෙවර

නිරෝගීමත් සත්ත්ව ගහනයකින් හා ඉහළ නිෂ්පාදන ඵලදායිතාවයකින් යුක්තව ආහාර සුරක්ෂිතතාවයට දායකවීමෙන් හා ආහාරවල සෞඛ්‍යාරක්ෂිතභාවයද තහවුරු කරමින් පශු සම්පත් ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් අත්පත්කර ගැනීම සඳහා තාක්ෂණික මගපෙන්වීම් හා සහාය ලබාදීම.

1.2.3. අරමුණු


- ❖ සත්ත්ව රෝග වලක්වාලන සහ මර්දනය කරන කාර්යක්ෂම සත්ත්ව සෞඛ්‍ය සේවාවක් සහතික කිරීම.
- ❖ සත්ත්ව ජාන සම්පත් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම ප්‍රවලිත කිරීම.
- ❖ ගුණාත්මක සත්ත්ව ආහාර සහ ආහාර සම්පත් ප්‍රයෝජනයට ගැනීම ප්‍රවලිත කිරීම.
- ❖ සත්ත්ව ආහාර කර්මාන්තයේ වර්ධනය සහ සංවර්ධනය ප්‍රවලිත කිරීම.
- ❖ තිරසාර පශු සම්පත් සංවර්ධනයක් උදෙසා පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් පවත්වාගෙන යාම.
- ❖ පශු එන්නත්සාර සහ අනෙකුත් පශු ජෛවීය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
- ❖ පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල පරීක්ෂණාගාර සේවා සම්මත පරීක්ෂණාගාර තුලදී ඉටුකර දීම.
- ❖ පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල පනත් සහ රෙගුලාසි අවශ්‍ය විටදී සංශෝධනය කිරීම, ඒ සඳහා උපදෙස් ලබාදීම හා නිරීක්ෂණය කිරීම.
- ❖ තාක්ෂණිකව සවිබල ගැන්වූ මානව සම්පත් සංවර්ධනය.
- ❖ කාර්යක්ෂමව හා ඵලදායි ලෙස තොරතුරු බෙදාහැරීම සහ තාක්ෂණික සේවා සැපයීම තහවුරු කිරීම.
- ❖ ව්‍යාපෘති හා වැඩසටහන් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ ඇගයීම.
- ❖ සත්ත්ව නිෂ්පාදනවල ආරක්ෂිතභාවය තහවුරු කිරීම.
- ❖ පරිසර හිතකාමී, විධිමත් සත්ත්ව පාලන ක්‍රම ප්‍රවර්ධනය කිරීම සහ ඊට අදාළව පහසුකම් සැපයීම.
- ❖ සතුන්ගේ සුභසාධනය සහ යහපැවැත්ම තහවුරු කිරීම.
- ❖ දෙපාර්තමේන්තු කාර්යයන් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම.

1.3. ප්‍රධාන කාර්යයන්

- ❖ ඉහළ නිෂ්පාදන හැකියාවක් සහිත උසස් ආරයේ ගව හා එළු ශුක්‍ර නිෂ්පාදනය කිරීම ඇතුළු ජාතික කෘතිම සිංචන වැඩසටහන මෙහෙයවීම.
- ❖ අභිජනන කටයුතු සඳහා සතුන්ගේ පෙළපත හා කාර්යසාධන වාර්තාකරණය.
- ❖ සත්ත්ව ජාන සම්පත් ආරක්ෂණය
- ❖ එළුවන්ගේ ආරය නැංවීම.
- ❖ පෝෂ කෘණු හා සයිලේජ් නිෂ්පාදනය සහ කෘණු අලෙවිකරණය ප්‍රවලිත කිරීම.
- ❖ රෝග වැලැක්වීමේ එන්නත්කරණ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ❖ දේශීයව එන්නත්සාර (කුර හා මුඛ, කාලගාත්‍රා, ගව රක්තාශ්‍රව, රැනිකට්, කුකුල් කොළරා බෘසෙල්ලා S19) සහ අනෙකුත් ජෛවීය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
- ❖ බුරුළු ප්‍රදාහය වැලැක්වීම, සුව කිරීම සහ බුරුළු නික්ෂේපන නිෂ්පාදනය.
- ❖ සැල්මොනෙල්ලෝසිස් හා රැනිකට් රෝග පාලනය.
- ❖ අති ව්‍යාධිජනක කුරුළු උණ රෝගයට එරෙහිව කාර්යක්ෂම පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ඇති කිරීම.
- ❖ සත්ත්ව රෝග හඳුනාගැනීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා පශු විමර්ශන මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම.

- කිරි ගොවිපොළවල සෞඛ්‍ය මට්ටම ඉහළ නැංවීම.
- පරීක්ෂණාගාර පහසුකම් ඉහළ නැංවීම සහ අවශ්‍යතාවයන් සැපිරීම.
- කිරි තාක්ෂණ පරීක්ෂණාගාර පහසුකම් හා යටිතල පහසුකම් ඉහළ නැංවීම.
- පශු සම්පත් ක්ෂේත්‍රය සඳහා විශ්ලේෂණ සහ උපදේශන සේවා සැපයීම.
- ක්ෂේත්‍ර මට්ටමේ සතුන් හඳුනාගැනීමේ කටයුතු සිදුකිරීම.
- දේශීය වෙළෙඳපොළ තුළ උසස් තත්ත්වයේ සත්ව ආහාර සුලභ කිරීම තහවුරු කිරීම.
- පශු නිෂ්පාදන හා ජෛවී ද්‍රව්‍ය නියාමනය.
- කුකුළු පාලනයට අදාළ නියාමන කටයුතු.
- සත්ත්ව නිරෝධායන හා ආවේක්ෂණ කටයුතු.
- අන්තර්ජාතික වෙළඳාම් පහසුකරණය.
- නිරෝධායන ඒකකවල යටිතල පහසුකම් ඉහළ නැංවීම සහ පරීක්ෂණාගාර පහසුකම් ඉහළ නැංවීම.
- පශු සම්පත් පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පශු සම්පත් ඩිප්ලෝමාධාරීන් බිහිකිරීම සඳහා සත්ත්ව පාලන විද්‍යාල (කරඳගොල්ල/ සීප්පුකුලම) පවත්වාගෙන යාම.
- සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අබණ්ඩ අධ්‍යාපන ආයතනයේ පුහුණු හා අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම.
- ඉලෙක්ට්‍රොනික්, මුද්‍රිත මාධ්‍ය හා ප්‍රදර්ශන මගින් තොරතුරු බෙදාහැරීම.
- ආදර්ශ ගොවිපොළ ඒකක ප්‍රදර්ශන පැවැත්වීම.
- පශු තාක්ෂණ උද්‍යානයේ විවිධ ගොවිපොළ ඒකක සංවර්ධනය හා නඩත්තු කිරීම.
- පශු සම්පත් ක්ෂේත්‍රයේ සමාජ ආර්ථික බලපෑම පිළිබඳ අධ්‍යයනයන් සිදුකිරීම.
- පශු සම්පත් සංඛ්‍යාන ප්‍රකාශන සැකසීම හා බෙදාහැරීම.
- පශු වෛද්‍ය සේවාව ප්‍රුළුල් කිරීම සඳහා පශු වෛද්‍ය කාර්යාලවල පහසුකම් වැඩිදියුණු කිරීම.
- පරිසර හිතකාමී පශු සම්පත් ගොවිපළ පහසුකරණය.
- ව්‍යාප්ති සේවාවන් සැපයීම.

1.4. සංවිධාන සටහන



DG	-අධ්‍යක්ෂ ජනරාල්
ADG /AH	-අතිරේක අධ්‍යක්ෂ ජනරාල් /සත්ත්ව සෞඛ්‍ය
ADG /LD	- අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ පශු සම්පත් සංවර්ධන
ADG/PDIA	- අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ වැඩසටහන් සංවර්ධන හා ජාත්‍යන්තර කටයුතු
ADG/VR	- අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ පශු පර්යේෂණ
ADG/ADM	- අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ පරිපාලන
D/AH	- අධ්‍යක්ෂ, සත්ත්ව සෞඛ්‍ය
D/HRD	- අධ්‍යක්ෂ, මානව සම්පත් සංවර්ධන
D/AB	- අධ්‍යක්ෂ, සත්ත්ව අභිජනන
D/LPE	- අධ්‍යක්ෂ, පශු සම්පත් සැලසුම් හා ආර්ථික
D/VRA	- අධ්‍යක්ෂ, පශු අණපනත් හා නීති
D/VR	- අධ්‍යක්ෂ, පශු පර්යේෂණ
D/ADM	- අධ්‍යක්ෂ, පරිපාලන
CA	-ප්‍රධාන ගණකාධිකාරී
CIA	- ප්‍රධාන අභ්‍යන්තර විගණක
R/AF	-ලේඛකාධිකාරී (සත්ත්ව ආහාර)
R/VD	-ලේඛකාධිකාරී (පශු ඖෂධ)
CAQO	-ප්‍රධාන සත්ත්ව නිරෝධායන නිලධාරී
CVE.Sp.	- ප්‍රධාන පශු ආර්ථික විශේෂඥ
C.Epi	- ප්‍රධාන වසංගතවේදී
PS/parasitology	- ප්‍රධාන විද්‍යාඥ/ පරපෝෂිත විද්‍යාව
PS/bacteriology/pathology	- ප්‍රධාන විද්‍යාඥ/ රෝග විද්‍යාව
PS/virology	- ප්‍රධාන විද්‍යාඥ/ වෛරස් විද්‍යාව
PS/microbiology	- ප්‍රධාන විද්‍යාඥ/ ක්ෂුද්‍රජීව විද්‍යාව

PS/veterinary biochem & nutrition technology- ප්‍රධාන විද්‍යාඥ/ වෛද්‍ය රසායන හා පෝෂණ තාක්ෂණය	
PS/rumin agrology	- ප්‍රධාන විද්‍යාඥ/ රෝමාන්තික කෘෂි විද්‍යාව
VI.Sp.	-පශු විමර්ශන විශේෂඥ
CV	-ප්‍රධාන එන්නත්වේදී
LE.Sp.	-පශු ව්‍යාප්තිසේවා විශේෂඥ
VR.Sp.	-පශු ප්‍රජනන විශේෂඥ
AB.Sp.	- සත්ත්ව අභිජනන විශේෂඥ
C.Agro.	-ප්‍රධාන ශස්‍යවේදී
VPH.Sp.	-පශු මහජන සෞඛ්‍ය විශේෂඥ
DE.Sp.	-කිරිගව ඉංජිනේරු විශේෂඥ
DD/AD (Admin)	- නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
ACC.	-ගණකාධිකාරී
DD/AH	-නියෝජ්‍ය අධ්‍යක්ෂ, සත්ත්ව සෞඛ්‍ය
DD/HRD	- නියෝජ්‍ය අධ්‍යක්ෂ, මානව සම්පත් සංවර්ධන
DD/AB	- නියෝජ්‍ය අධ්‍යක්ෂ, සත්ත්ව අභිජනන
DD/VRA	- නියෝජ්‍ය අධ්‍යක්ෂ, පශු අණපනත් හා නීති
DD/LPE	- නියෝජ්‍ය අධ්‍යක්ෂ, පශු සම්පත් සැලසුම් හා ආර්ථික
DD/R	- නියෝජ්‍ය අධ්‍යක්ෂ, පර්යේෂණ
DD/VR	- නියෝජ්‍ය අධ්‍යක්ෂ, පශු පර්යේෂණ
DD/TS	- නියෝජ්‍ය අධ්‍යක්ෂ, තාක්ෂණ සේවය
VE.Sp.	-පශු ආර්ථික විශේෂඥ
DG Office	- අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
OIC-	-ස්ථාන භාර නිලධාරී

1.5. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- ❖ සත්ත්ව අභිජනන අංශය
- ❖ සත්ත්ව සෞඛ්‍ය අංශය
- ❖ පශු අණුපනත් හා නීති අංශය
- ❖ පශු සම්පත් සැලසුම් හා ආර්ථික අංශය
- ❖ මානව සම්පත් සංවර්ධන අංශය
- ❖ පශු පර්යේෂණ ආයතනය
- ❖ මුදල් අංශය
- ❖ පරිපාලන අංශය

1.6. දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ යටතේ පවතින ආයතන

- ❖ සත්ත්ව අභිජනන අංශය
  - කෘත්‍රිම සිංචන මධ්‍යස්ථාන (කුණ්ඩසාලේ, පොළොන්නරුව)
  - එළු අභිජනන මධ්‍යස්ථාන (තෙලහැර, ඉඹුලන්දණ්ඩ)

- ❖ සත්ත්ව සෞඛ්‍ය අංශය
  - පශු විමර්ශණ මධ්‍යස්ථාන (25)

- ❖ පශු අණුපනත් හා නීති අංශය
  - සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථාන (කොළඹ, කටුනායක, මත්තල, යාපනය)

- ❖ මානව සම්පත් සංවර්ධන අංශය
  - සත්ත්ව පාලන විද්‍යාල (කරදගොල්ල, සීප්පුකුලම)
  - අබණ්ඩ අධ්‍යාපන ආයතනය- ගන්නෝරුව
  - පශු තාක්ෂණ උද්‍යානය- ගන්නෝරුව
  - පශු ව්‍යාප්ති සේවා කවුළුව- ප්‍රධාන කාර්යාලය
  - ව්‍යවසායකත්ව හා ආයෝජන ප්‍රවර්ධන ඒකකය

- ❖ පශු පර්යේෂණ ආයතනය
  - මධ්‍යම කුකුළු පර්යේෂණ මධ්‍යස්ථානය - කරදගොල්ල
  - සත්ව විෂාණු රසායනාගාරය- පොල්ගොල්ල
  - කිරි තාක්ෂණ රසායනාගාරය- ගන්නෝරුව

1.7. විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

<u>ගුණාත්මක තෘණ/පෝෂ ආහාර ප්‍රභේද හඳුන්වාදීම සහ වැඩිදියුණු කළ පෝෂණ කළමනාකරණ පුරුදු තුළින් කුඩා පරිමාණ කිරි ගොවීන්ගේ නිෂ්පාදනය වැඩිදියුණු කිරීම.</u>

මෙම ව්‍යාපෘතිය මගින් CO 6 , Mullato- ii සහ Stylosanthus යන තෘණ ප්‍රභේද ආනයනය කරන ලදී.

1. CO 6- දඬු කි. ග්‍රෑ. 30 ක් ආනයනය කරන ලද අතර එයින් දඬු කැබලි 22,200 ක් ගොවීන් වෙත බෙදා දෙන ලදී. එමෙන්ම 2025.12.31 වන විට අක්කර 06 ක තෘණ වගාවක් ව්‍යාප්ත කර ඇත.

2. Stylosanthus- බීජ කි. ග්‍රෑ. 50 ක් ආනයනය කරන ලද අතර එයින් කි. ග්‍රෑ. 35 ක් ගොවීන් හට බෙදා දෙන ලදී. අක්කර 10 ක තවාන් දැමීම සිදුකර ඇත.

3. Mullato ii- බීජ කි. ග්‍රෑ. 100 ක් ආනයනය කරන ලදී. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට මෙම බීජ නිරෝධායන කාලසීමාව පසුකරමින් සිටින අතර ඉදිරියේදී ගොවීන් වෙත බෙදා දීමට බලාපොරොත්තු වේ.

ඉස්සන්ගේ රෝග ආවේක්ෂණ වැඩසටහන

මෙය ඉස්සන් රෝග සම්බන්ධයෙන් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද පළමු ආවේක්ෂණ වැඩසටහනයි.

පොලිමරේස් දාම ප්‍රතික්‍රියාව (PCR) භාවිතයෙන් පරීක්ෂා කරන ලද රෝග වූයේ එන්ටරොසයිටොසූන් හෙපටොපීනෙයි (EHP), සුදු ලප සින්ඩ්‍රෝම් වෛරසය (WSSV), උග්‍ර හෙපටොපංක්‍රියාටික් නෙරෝසිස් රෝගය (APHND) සහ බෝවන හයිපොඩර්මල් සහ රක්තපාත නෙරෝසිස් වෛරසය (IHHNV) ය. ශ්‍රී ලංකාවේ නොමැති රෝග තත්ත්ව දන්ත රැස් කිරීම මෙම නිරීක්ෂණවල අරමුණ විය.

2025 ජූලි සිට නොවැම්බර් දක්වා සාම්පල එකතු කරන ලදී. වයඹ පළාතේ ගොවිපල 18 කින් ඉස්සන් සාම්පල ලබා ගන්නා ලදී. පේරාදෙණියේ පශු වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අණුක ජීව විද්‍යාගාරයේ ලෝක සත්ත්ව සෞඛ්‍ය සංවිධානයේ (WOAH) ප්‍රමිතීන්ට අනුව DNA නිස්සාරණ 1,155 ක් සහ පොලිමරේස් දාම ප්‍රතික්‍රියා 3,038 ක් සිදු කරන ලදී.

මෙම ව්‍යාපෘතිය මගින් අවසානයේ සියලුම ගොවිපලවල් වල EHP හඳුනාගෙන ඇති අතර, කිසිදු ගොවිපලක APHND සහ IHHNV අනාවරණය වී නොමැත. ගොවිපල 02 ක WSSV හඳුනාගෙන ඇත. ළඟා කරගත් භෞතික ප්‍රගතිය 100% කි.

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. 2025 වර්ෂය තුළදී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන්හි මූල්‍ය ප්‍රගතිය

අ/අ	වැඩසටහන	2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.)	2025.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි)	මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස
1	ප්‍රාග්ධන වියදම්	95.00	38.58	40.61
2	පුනරාවර්තන වියදම්	938.38	929.85	99.09
	සංවර්ධන වැඩසටහන්			
1	සත්ත්ව සෞඛ්‍ය හා පශු පර්යේෂණ	262.00	175.34	66.92
2	පශු සම්පත් සංවර්ධන සහ පුහුණු	360.00	233.19	64.77
	විදේශ ව්‍යාපෘති			
1	ගුණාත්මක තෘණ/පෝෂ ආහාර ප්‍රභේද හඳුන්වාදීම සහ වැඩිදියුණු කළ පෝෂණ කළමනාකරණ පුරුදු තුළින් කුඩා පරිමාණ කිරි ගොවීන්ගේ නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය- FAO	0.112	0.063	57.02
2	ඉස්සන් ආශ්‍රිත රෝග ආවේක්ශණ වැඩසටහන -FAO	0.5927	0.3572	60.26
	විශේෂ ව්‍යාපෘති			
1	ආපදා සහන, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ	2,200	2,200	100.00

2.2. 2025 වර්ෂය තුළදී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන්ගේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය

අ/ප	වැඩසටහන	2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.)	2025.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය % ක් ලෙස
	සංවර්ධන වැඩසටහන්			
1	සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය	185	133.35	72.08
2	පශු සම්පත් පර්යේෂණ වැඩසටහන	85	57.97	68.20
3	උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම	24	18.64	77.68
4	කුර හා මුඛ රෝග එන්නත දේශීයව නිෂ්පාදනය	38	12.20	32.11
5	සතුන්ගේ බෝවන රෝග වැලැක්වීමේ වැඩසටහන	45	43.77	97.28
6	බුරුළු ප්‍රදාහ පාලන වැඩසටහන	22.4	9.56	42.72
7	සත්ත්ව පාලන ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම	25	24.90	99.63
8	සතුන් හඳුනාගැනීමේ වැඩසටහන	20	7.33	36.69
9	වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන	2	0.86	43.36
10	පශු විමර්ෂණ මධ්‍යස්ථාන වල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම	5	4.13	82.63
11	තත්ව ආරක්ෂණ වැඩසටහන, සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන, පශු සම්පත ප්‍රචලිත කිරීමේ වැඩසටහන,පොත් හා ප්‍රකාශන වැඩසටහන	22	4.35	19.80
12	ආහාර ආරක්ෂණය හා අපනයන කටයුතු සඳහා පහසුකරණය සඳහා සත්ව ආහාර හා පශු නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහතික කිරීම	40	28.18	70.46
13	පශු වෛද්‍ය කාර්යාලවල සේවා සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම	15	12.90	86.0
14	කුකුළු සෞඛ්‍ය කළමනාකරණය මඟින් කුකුළු මස් සහ බිත්තර අපනයනයට පහසුකම් සැලසීම	10	8.66	86.61
15	පූහුණු ධාරිතාවය ඉහළ නැංවීම	10	7.65	76.56
16	සත්ත්ව නිරෝධායන ඒකක පුළුල් කිරීම හා නවීකරණය	5	0.32	6.46
17	කුණ්ඩසාලේ කෘතිම සිංචන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම තුළින් තත්වයෙන් උසස් ගව ශුක්‍ර වඩි නිෂ්පාදනය හා බෙදාහැරීම ඉහළ නැංවීම	100	45.72	45.72

2.3. පශු සම්පත් සංවර්ධනය උදෙසා 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

1. මානව සම්පත් සංවර්ධන අංශය

අ. සත්ත්ව පාලන ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම

කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයේ පශු සම්පත් තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 6) සඳහා සිසුන් 46 ක් සමාලෝචිත කාලසීමාව අවසන් වන විට පුහුණුව ලබන අතර, එම සිසුන්ගේ විභාග පැවැත්වීම හා ගොවිපල අලුත්වැඩියාව සඳහා භාණ්ඩ/ සේවා මිලදී ගැනීම කටයුතු **2025.12.31** වන විට සම්පූර්ණයෙන් අවසන් කර ඇත. සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලයේ නේවාසිකව සිසුන් **25**ක් සිටින අතර මුළු සිසුන් **45** ක් (NVQ 04) පාඨමාලාව හදාරනු ලැබේ. උක්ත පාඨමාලා හදාරන සිසුන් එම විෂයය කරුණු වලට සමගාමීව ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වන අයුරු පහත ඡායාරූප වල දැක්වේ.



1.1.1 මියගිය සතකු පරීක්ෂා කරමින්



1.1.2. තෘණ දුඩු සිටුවීමට සූදානම්වෙමින්



1.1.3. සයිලේජ් යෑදීම සඳහා සූදානම් වෙමින්

ආ. පුහුණු ධාරිතාව ඉහළ නැංවීම

2025.12.31 දින වන විට මෙම වැඩසටහන මඟින් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තුමේන්තුවේ පුහුණු වැඩසටහන් 38 ක් පවත්වා ඇති අතර, කාර්යක්ෂමතා කඩයිම් විභාග I /II/ II යටතේ විභාග 06 ක් පවත්වා ඇත. පශු පර්යේෂණ නිලධාරීන් බදවා ගැනීමේ විභාගයක් පවත්වා ඇත.

ඇ. පශු සම්පත ප්‍රචලිත කිරීමේ වැඩසටහන

මේ යටතේ සමාලෝචිත කාලසීමාව අවසන් වන විට ගුවන්විදුලි ප්‍රචාරක වැඩසටහන් 75 ක් සහ රූපවාහිනී හා වීඩියෝ වැඩසටහන් 138 ක් ඉදිරිපත් කිරීමට හැකි වී ඇති අතර, පශු සම්පත ප්‍රචලිත කිරීමේ මාධ්‍ය වැඩසටහනට සමගාමීව පොත් 12 ක මුද්‍රණය කිරීමේ කටයුතු සිදු කර ඇත.

ඇ. පොත් හා ප්‍රකාශන

Dairy Hub ව්‍යාපෘතියට සමගාමීව 2025.12.31 වන විට එහි ප්‍රචාරණ කටයුතු සඳහා ලිපිගොනු කවර 5000 ක් සහ අත් පත්‍රිකා 2000 ක් මුද්‍රණය කර ඇත.

2. පශු අණුපනත් හා නීති අංශය

අ. සතුන් හඳුනා ගැනීමේ වැඩසටහන

ක්ෂේත්‍ර ව්‍යාපෘති නිලධාරීන් විසින් ලියාපදිංචි කළ ගොවිපළවල නිරීක්ෂණය කරනු ලබන අතර, ඒවායේ සිටින සතුන්ගේ කන් සලකුණු කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු වේ. 2025.12.31 කාල සීමාව වන විට සතුන් 15,236 දෙනෙකුගේ කන් සලකුණු සවි කර ඇති අතර බෙදා හරින ලද කන් සලකුණු ප්‍රමාණය 46,376 කි. එසේම Ear Tags , Marker Pens, Tag Pins හි ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රසම්පාදන ඒකකයට යවා ඇති අතර උප ලේඛන රු.මී. 07 ක මුද්‍රණය කර අවසන් වී ඇත.

ආ. සත්ත්ව නිරෝධායන ඒකක පුළුල් කිරීම හා නවීකරණය

මෙම ව්‍යාපෘතිය සඳහා මිලියන 05 ක් වෙන්ව තිබුනද, ඉඩමෙහි අයිතිය පිළිබඳ ගැටලුවක් මත කොළඹ සත්ත්ව නිරෝධායන කාර්යාලයේ අළුත්වැඩියා කිරීමේ කාර්යය ප්‍රමාද වී ඇත. එසේම එහි ඇති Incinerator පුරාවිද්‍යා ස්මාරකයක් බැවින් ඒ නිර්ණායක යටතේ කාර්යය කිරීමට උපදෙස් දී ඇත.

ඇ. තත්ත්ව ආරක්ෂණ වැඩසටහන

තත්ව ආරක්ෂණ හා නිරෝධායන කටයුතු වැඩසටහන යටතේ සිදු කරනු ලබන කාර්යයන් සඳහා හඳුනා ගත් ඉලක්ක සත්ත්ව ආහාර සම්බන්ධ කටයුතු, පශු ඖෂධ අධිකාරියේ කටයුතු, සත්ත්ව හා සත්ත්ව නිෂ්පාදන ආනයන හා අපනයන සඳහා පූර්ව නිෂ්කාශන නිකුත් කිරීම සහ නිරෝධායන කටයුතු ආවේක්ෂණය කිරීම යන කාර්යයන් සිදු කරයි. සමස්ථ වශයෙන් 98% ක ප්‍රගතියක් දක්වා ඇත.

3. සත්ත්ව සෞඛ්‍ය අංශය

අ. සතුන්ගේ බෝවන රෝග වැලැක්වීමේ වැඩසටහන

මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් වූ මුදල රු.මී. 45 කි. මේ යටතේ කිරි නිෂ්පාදන කර්මාන්තය සඳහා බලපාන, හඳුනාගත් ප්‍රධාන රෝග 05 ක් සඳහා එන්නත්කරන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කෙරේ.මෙම එන්නත්කරන වැඩසටහන් රෝගය අනුව පහත ප්‍රදේශ වල ක්‍රියාත්මක වේ.

1. කුර හා මුඛ රෝගය (FMD) - මුළු දිවයින පුරා
2. ගව රක්තාශ්‍රව රෝගය (HS) - උතුරු මැද පළාත හා උතුරු නැගෙනහිර පළාත
3. කාල ගාත්‍ර රෝගය (BQ) - උතුරු පළාත, උතුරු මැද පළාත හා වයඹ පළාත
4. සමේ ගැටති රෝගය (LSD) - උතුරු මැද පළාත, ඌව පළාත, මධ්‍යම පළාත, වයඹ පළාත, සබරගමු පළාත, උතුරු පළාත, නැගෙනහිර පළාත හා දකුණු පළාත
5. බෘසෙල්ලෝසිස් (Bovine Brucellosis)
   අම්පාර,අනුරාධපුර,මඩකලපුව,පුත්තලම,මොණරාගල,වව්නියා,නුවරඑළිය,පොලොන්නරුව, හම්බන්තොට,බදුල්ල,ත්‍රිකුණාමලය,කිලිනොච්චිය, කුරුණෑගල හා මන්නාරම් යන දිස්ත්‍රික්ක

රෝගය	බෙදාහරින ලද එන්නත් වඩි ප්‍රමාණය	එන්නත් කරන ලද සතුන් ගණන
කුර හා මුඛ	300,660	254,204
කාලගාත්‍ර	101,937	97,899
ගව රක්ත්‍රාශ්‍රව	125,040	155,252
සමේ ගැටති	41,780	5,885
බෘසෙල්ලා S-19	10,200	6,468

පසුගිය වසරට සාපේක්ෂව කුර හා මුඛ රෝගය වාර්ථාවීම 33% ක් අඩුවී ඇති අතර, කාලගාත්‍ර රෝග තත්වය 100 ක් පාලනය කිරීමට හැකිවී ඇත. මෙම වැඩසටහන සඳහා චෙන්කල මුදල සම්පූර්ණයෙන් වැයවී ඇත. 2025.12.31 වන විට 100% ක භෞතික ප්‍රගතියක් ලබා ගැනීමට හැකිවී ඇත.

ආ. වනජීවී රෝග ආවේක්ෂණ මඟින් මිනිසාට හා ගොවිපල සතුන්ට වනජීවීන් හරහා රෝග සම්ප්‍රේෂණය අවම කිරීමේ ව්‍යාපෘතිය

මෙම සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.මි.02 ක මුදලක් චෙන්කර ඇති අතර වනජීවීන් මගින් පශු සම්පත් ක්ෂේත්‍රයට බලපෑ හැකි රෝග හඳුනා ගැනීම සිදු කරයි. මෙම වැඩසටහන අම්පාර, දඹුල්ල, අනුරාධපුර, හම්බන්තොට, හෝමාගම, කුණ්ඩසාලේ, මාන්කුලම්, පොළොන්නරු හා රත්නපුර යන ප්‍රදේශ වල ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය යටතේ දැනට පශු විමර්ෂණ මධ්‍යස්ථාන වල පශ්චාත් මරණ පරීක්ෂණ 63 ක් සිදුකර ඇති අතර සුකර කර්මාන්තයට වැදගත්වන සුකර උණ රෝගය වනාශ්‍රිත ඌරන් තුල ද පවතින බව හඳුනාගෙන ඇත. 2025.12.31 දිනට මෙම ව්‍යාපෘතිය 70% ක භෞතික ප්‍රගතියක් ලබා ඇත.

ඇ. කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනා ගැනීමේ හා ආවේක්ෂණ පහසුකම් වැඩි දියුණු කිරීම.

මෙම සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.මි.05 ක මුදලක් වෙන් කර ඇති අතර, මත්ස්‍ය අපනයන කටයුතු වලදී අවශ්‍ය පර්යේෂණ කටයුතු සිදුකර ඒ සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම හා මත්ස්‍ය අපනයන ගොවිපලවල් ලියාපදිංචිය සඳහා ජෛව ආරක්ෂණ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරලීම මෙන්ම ලියාපදිංචියට අවශ්‍ය නිර්දේශයන් ලබාදීම මෙමඟින් සිදු කරයි.

මෙම ව්‍යාපෘතිය මත්ස්‍ය අපනයන ගොවිපල පිහිටීම අනුව බස්නාහිර පළාත, උතුරුමැද පළාත සහ මාතර, කෑගල්ල, හලාවත, කුරුණෑගල, ත්‍රිකුණාමලය, මහනුවර හා මාතලේ යන දිස්ත්‍රික්ක තුල ක්‍රියාත්මක කෙරේ. ලෝක සත්ත්ව සෞඛ්‍ය සංවිධානය හා එක්ව PVS Aquatic Animal Health Mission නම් වැඩසටහනක් ක්‍රියාත්මක කල අතර, මෙමඟින් ශ්‍රී ලංකාවේ මත්ස්‍ය කර්මාන්ත හා මත්ස්‍ය අපනයන ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීමට අවශ්‍ය නිර්දේශයන් ලබාගැනීම සිදු කෙරිණි.

රටේ ඇති වූ අප්‍රිකානු සුකර උණ වසංගත රෝගී තත්වය හේතුවෙන් ගත් විශේෂ තීරණයකට අනුව එම රෝගී තත්වය පාලනය සඳහා අවශ්‍ය යෙදවුම් මෙම වැඩසටහන යටතේ ලබාදීමට පියවරගත් අතර, ඒ අනුව එම යෙදවුම් දිවයින පුරා ඇති හඳුනාගත් ගොවිපලවල් වෙත බෙදාහැරීම ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල මගින් සිදුකරන ලදී.

මෙම වැඩසටහන මඟින් මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙන අපනයන මත්ස්‍ය ගොවිපල් 115 ක ගුණාත්මකතාවය ඉහල නැංවීමට හැකිවී ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා 2025.12.31 වන විට රු.මි.4.13 ක මුදලක් වැය කර ඇති අතර 95% ක භෞතික ප්‍රගතියක් ලබා ඇත.

ඈ. කුකුළු රෝග කළමණාකරණය හරහා කුකුළු මස් හා බිත්තර අපනයනය සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම

මෙම ව්‍යාපෘතිය හරහා මුළු දිවයිනම ආවරණය වන පරිදි කුරුළු උණ රෝගය, රැනිකට් රෝගය හා සැල්මොනෙල්ලා යන රෝග තත්වයන් පාලනය සිදුකරයි.

ඒ අනුව අභිජනන ගොවිපලවල, බීජ රක්කනාගාරවල හා බිත්තර අපනයන ගොවිපල් වල ජෛව ආරක්ෂණ ක්‍රමවේදයන් අධික්ෂණ කටයුතු සිදුකරනු ලබන අතර, වාර්ෂික ලියාපදිංචිය සඳහා නිර්දේශයන් ලබා දේ. වාණිජමය බිත්තර අපනයන කුකුල් ගොවිපල වෙත ආර්ථිකමය වශයෙන් වැදගත් වන කුකුල් රෝග සඳහා පරීක්ෂා කර බිත්තර අපනයනයට අවශ්‍ය සෞඛ්‍ය සහතික නිකුත් කිරීමෙන් අපනයනය ප්‍රවර්ධනය කිරීමට හැකිවී ඇත.

රැනිකට් රෝග පාලනය සඳහා අදාල එන්නත් දිවයින පුරා පශු වෛද්‍ය කාර්යාල හා පශු විමර්ෂණ මධ්‍යස්ථාන මඟින් බෙදා හැරීම සිදු කරන අතර, 2025.12.31 වන විට රැනිකට් එන්නත් වඩි 4,485,200 ක් බෙදාහැර ඇත.

මෙම එන්නත් සුළු පරිමාණ ගොවිපල් සඳහා නොමිලේ ලබාදෙන අතර මෙමගින් වසංගත රෝගී තත්වයක් ඇති නොවන මට්ටමට රෝගය පාලනය වී ඇත.

සැල්මොනෙල්ලා රෝග පාලන වැඩසටහන යටතේ සමාලෝචිත කාලසීමාව අවසන් වන විට කුකුළු අභිජනන ගොවිපොළ නිරීක්ෂණ 93 ක් සහ බීජ රක්කවනාගාර නිරීක්ෂණ 111 ක් සිදුකර ඇත. කුරුළු උණ ආවේක්ෂණ කටයුතු යටතේ රුධිර සාම්පල 3,442 ක් හා වසුරු සාම්පල සහ Cloacal swabs 22,492 ක් රෝග පරීක්ෂාව සඳහා යොමුකර ඇත.

අභිජනන ගොවිලවල් හා බීජ රක්කනාගාරවල සැල්මොනෙල්ලා රෝග තත්වයන් පාලනය කිරීමෙන් වාණිජ ගොවිපල් සඳහා එම රෝගය පැතිරියාම පාලනය කර ඇත. තවද කුරුළු උණ ආවේක්ශණය මගින් කුරුළු උණෙන් තොර රටක් පවත්වා ගැනීමට හැකිවී ඇත. 2025.12.31 දිනට මෙහි භෞතික ප්‍රගතිය 95% කි.

4. පශු සම්පත් සැලසුම් හා ආර්ථික අංශය

අ. සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන

මේ යටතේ පශු සම්පත් ක්ෂේත්‍රයේ නිෂ්පාදන දත්ත, සත්ත්ව ගහණය, සත්ත්ව ගොවිපල ලියාපදිංචි සංඛ්‍යාව මාසිකව හා කාර්තුමය වශයෙන් දත්තයන් ලබා දේ. එසේම පශු වෛද්‍ය කාර්යාලවල මානව හා භෞතික සම්පත්වල තොරතුරු එකතු කරනු ලැබේ. එම තොරතුරු ආශ්‍රිතව Livestock Statistical Bulletin, Livestock Outlook, Annual Report වැනි ප්‍රකාශන ප්‍රකාශයට පත් කරනු ලබයි. එසේම ක්ෂේත්‍රයේ ව්‍යාවසායකයින්ගේ සහ නිෂ්පාදකයින්ගෙන් ලබා ගන්නා දත්ත පදනම් කර ගනිමින් Poultry Forecast, Poultry Monthly Bulletin, Dairy Bulletin ප්‍රකාශයට පත් කරයි. 2025.12.31 වනවිට Poultry Forecast, Livestock Statistical Bulletin, Livestock Outlook සහ Annual Performance Report සහ Annual Report යන ප්‍රකාශන සිදුකර අවසන්ව ඇත.

තව ද ගොවිපල ලියාපදිංචි කිරීමේ වැඩසටහනට අදාල පෝරම පළාත් මට්ටමින් නිකුත් කිරීම සඳහා එම පෝරමයන්, රෙජිස්ටාර් පොත් මුද්‍රණ කර පළාත් 09 වෙත බෙදා හැරීමේ කාර්යය සිදු කර ඇත. සමාලෝචිත කාලසීමාව අවසන් වන විට ලියාපදිංචි වී ඇති මුළු ගොවිපල සංඛ්‍යාව 46,009 ක් වේ.

මෙම අංශය වෙත පශු වෛද්‍ය කාර්යාල හරහා ලැබෙන දත්තවල ප්‍රශස්ත බව වැඩි කිරීමේ අරමුණින් මේ වන විට දිවයින පුරා පළාත් 09 ආවරණ වන පරිදි පුහුණු වැඩමුළු පවත්වනු ලැබේ.

ආ. පශු වෛද්‍ය ක්ෂේත්‍රෙය් සේවා සැපයුම් පද්ධතිය වැඩි දියුණු කිරීම

ආනයන හා අපනයන කටයුතුවලට ගතවන කාලය අවම කිරීම සහ ජාත්‍යන්තර වෙළඳාමේ නියැලී සිටින ප්‍රජාවට ක්‍රියාවලීන් පහසු කිරීම සඳහා 2023 සිට සතුන් සහ සත්ව නිෂ්පාදන ආනයනය හා අපනයනය සම්බන්ධ ක්‍රියාකාරකම් ඩිජිටල්කරණය සහ ජාලකරණය කිරීමට VRRAS ව්‍යාපෘතිය ආරම්භ කිරීම තුලින් දෙපාර්තමේන්තුව පියවර ගෙන තිබේ. එය පශු අණ පනත් සහ නීති අංශය, පශු පර්යේෂණ ආයතනය සහ සත්ව නිරෝධායන මධ්‍යස්ථානවල කටයුතු ඩිජිටල්කරණ සහ ජාලකරණ ක්‍රියාවලියකි.

එහි සංවර්ධන කටයුතු සඳහා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුලින් බාහිරින් සේවා ලබා ගනියි. පශු පර්යේෂණ ආයතනයෙහි උප පද්ධතිවලට අදාළ විවිධ වර්ගයේ මොඩියුල පවතින අතර ඒවා දැනටමත් සංවර්ධනය කර සහ පරිශීලක ප්‍රතිග්‍රහන පරීක්ෂණයට (User Acceptance Test) ද භාජනය වී ඇත. පශු අණ පනත් සහ නීති අංශයට සහ නිරෝධායන කාර්යාලවලට අදාළ උප පද්ධති තවමත් සංවර්ධනය වෙමින් පවතින අතර මෙම වසර තුළ සමස්ත පද්ධතියම ක්‍රියාත්මක වීමට අපේක්ෂිතය.

5. පශු පර්යේෂණ ආයතනය

අ. උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම

මෙම ව්‍යාපෘතිය මඟින් උසස් තත්ත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය තවදුරටත් පුළුල් කිරීම සිදු කෙරේ. ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ ගව, රක්තශ්‍රාව, කාලගාත්‍රා, රැනිකට් එන්නත් දේශීයව නිපදවීම වැඩි දියුණු කර ඇත. සමාලෝචිත කාලසීමාව අවසන් වන විට සමස්ත වශයෙන් 91% ක භෞතික ප්‍රගතියක් ලබා ඇත.

එන්නත් වර්ගය	වාර්ෂික ඉලක්කය	**2025.12.31** වන විට නිෂ්පාදනය කරන ලද එන්නත් වඩි ප්‍රමාණය
HS (OAV)	125,000	125,040
HS (APV)	20,000	20,040
BQ	90,000	110,517
Brucella S19	10,000	7,500
ND (Primary)	2,874,000	3,000,800
ND (Secondary)	2,521,000	3,042,600
පෞද්ගලික ආයතන සඳහා ඉල්ලුම් අනුව එන්නත් නිෂ්පාදනය කිරීම		
එන්නත් වර්ගය	**වාර්ෂික ඉලක්කය**	**2025.12.31 වන විට නිෂ්පාදනය කරන ලද එන්නත් වඩි ප්‍රමාණය**
Fowl Cholera (FC)	400,000 (ඉල්ලුම පරිදි)	348,840

ආ. පශු සම්පත් පර්යේෂණ වැඩසටහන

මෙම ව්‍යාපෘතිය යටතේ පර්යේෂණ ව්‍යාපෘති 23ක් දැනට ක්‍රියාත්මක වේ. ඉල්ලුම පරිදි සාම්පල පරීක්ෂාව සහ ජෛවීය නිෂ්පාදනයන් සිදු කිරීම මේ මඟින් ඉටු කරනු ලබයි. සමාලෝචිත කාලසීමාව අවසන් වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 100% කි.

ක්‍රියාකාරකම	**වාර්ෂික ඉලක්කය**	**2025.12.31 වන විට ප්‍රගතිය**
ජෛවීය නිෂ්පාදන	ඉල්ලුම පරිදි	
විශ්ලේෂණ වාර්තා		54,789
ව්‍යවස්ථාපිත කටයුතු සඳහා විද්‍යාගාර පරීක්ෂණ		12,562
රෝග නිරීක්ෂණ වාර්තා		2,037
CMT reagent		17 ලී
Pullorum antigen doses		109,500
RBPT antigen doses		12,000
MRT antigen doses		9,200
Teat dip solution		53.765 ලී

ඇ. කුර හා මුඛ රෝග එන්නත දේශීයව නිෂ්පාදනය

මෙම ව්‍යාපෘතිය යටතේ දේශීයව කුර හා මුඛ රෝග එන්නත් සකස් කිරීම සිදු කරනු ලැබේ. 2025 වර්ෂය සඳහා 450,000 නිෂ්පාදනයට සැලසුම් කර ඇත. දෙපාර්තමේන්තුවේ සත්ත්ව සෞඛ්‍ය අංශයට එන්නත් මාත්‍රා 326,100 ක් නිකුත් කරන ලදී. 2025.12.31 වන විට ආසන්න වශයෙන් 100,000 කට ප්‍රමාණවත් කුර හා මුඛ රෝග ප්‍රතිදේහජනක නිෂ්පාදනය කර ඇත. සමස්ත වශයෙන් මෙම ව්‍යාපෘතිය **72%** ක භෞතික ප්‍රගතියක් ලබා ඇත.

ඈ. බුරුළු ප්‍රදාහ පාලන වැඩසටහන

මෙම ව්‍යාපෘතිය යටතේ බුරුළු ප්‍රදාහ නික්ෂේපණ **30,000** ක් සෑදීමට ඉලක්ක කර ඇත. සමාලෝචිත කාලය තුළ බුරුළු ප්‍රදාහ නික්ෂේපණ 33,671 නිෂ්පාදනය කර ඇති අතර 27,373 ක්ෂේත්‍රයට නිකුත් කර ඇති අතර 77% ක භෞතික ප්‍රගතියක් ලබා ඇත.

ඉ. ආහාර ආරක්ෂණය හා අපනයන කටයුතු පහසුකරණය සඳහා සත්ත්ව ආහාර හා පශු නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීම

2018 වසරේදී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය හරහා සත්ත්ව ආහාර හා පශු නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීම මඟින් අපනයන පහසුකරණය සහ ආහාර ආරක්ෂණය තහවුරු කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ මෙම වසර

සඳහා 2025.12.31 වන විට සත්ත්ව ආහාර හා සත්ත්ව නිෂ්පාදන සාම්පල 9,988 ක ගුණාත්මකභාවය විශ්ලේෂණය කර ඇත. සමස්ත භෞතික ප්‍රගතිය 92% කි.

6. සත්ත්ව අභිජනන අංශය

අ. සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය

<u>අධිශීත ගව ශුක්‍ර ආනයනය කිරීම , නිෂ්පාදනය කිරීම හා දිවයින පුරා බෙදා හැරීම</u>

මේ සඳහා සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය මගින් රු. මිලියන 27.31 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. 2025.12.31 වන විට G to G ක්‍රමවේදය යටතේ Milking Gir ගව ශුක්‍ර වඩි 20000 ක් ද, තරඟකාරී ලංසු ක්‍රමය යටතේ Jersey - 4000, Boer - 2000, Nili Ravi - 2000, Brazilian Milking Gir - 10,000 ශුක්‍ර වඩි මිල දී ගැනීමට අදාලව ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඇත. එහිදී Jersey, Nili -Ravi සහ Milking Gir ගව ශුක්‍ර වඩි මිලදී ගැනීමට අදාල ටෙන්ඩර් ප්‍රදානය සමාලෝචිත කාලසීමාව අවසන් වන විට සිදුකර ඇති අතර, Boer එළු ශුක්‍ර වඩි මිලදී ගැනීමට මිලදී ගැනීමට එවා තිබූ මිලපත්‍රිකා පිරිවිතර වලට අනුකූල නොවූ බැවින් එම මිලදී ගැනීම 2026 වර්ෂයේ සිදුකිරීමට තීරණය විය.

එසේම කුණ්ඩසාලේ මධ්‍යම කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානයෙන් දේශීයව හා ආනයනික පූං ගවයින්ගෙන් ලබා ගන්නා ගව ශුක්‍ර වඩි පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් ගබඩා කරමින් පළාත් මට්ටමින් දිප ව්‍යාප්තව බෙදා හැරීම කටයුතු සිදු කරගෙන යනු ලබයි. එසේම මේ වන විට ශුක්‍ර වඩි 334,796 නිෂ්පාදනය කර ඇති අතර, බෙදා හැරීම් හා තොග ශේෂයන් පහත පරිදි වේ.

ගව ශුක්‍ර වඩි වර්ගය	බෙදා හැරීම	තොග ශේෂය
දේශීය	231,019	678,239
ආනයනික	3,652	58,824
ලිංග නිර්ණය කරන ලද	133	3,008
මුළු එකතුව	234,804	740,071

<u>කෘත්‍රිම සිංචන පුහුණු වැඩසටහන්</u>

එසේම මෙම අංශය මඟින් ජාතික කෘත්‍රිම සිංචන වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා කෘත්‍රිම සිංචන පුහුණු කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යනු ලබයි. මේ වන විට, එනම් 2025.12.31 දින වන විට පහත සඳහන් ලෙස පුහුණු වැඩසටහන් සිදු කර ඇත.

පුහුණු වැඩසටහන	ප්‍රමාණය
පශු සම්පත් සංවර්ධන නිලධාරීන් සඳහා වන දින 14 පුහුණු වැඩසටහන් ප්‍රමාණය	02
පුද්ගලික කෘත්‍රිම සිංචන ශිල්පීන් සඳහා වන දින 24 පුහුණු වැඩසටහන්	01
ප්‍රායෝගික පරීක්ෂණ (සහභාගිවන්නන් 33 න් සමන්විත)	05
කෘත්‍රිම සිංචන ශිල්පීන්ගේ දැනුම යාවත්කාලීන කරන පුහුණු වැඩසටහන් (සහභාගි වන්නන් 20 න් සමන්විත)	02

එසේම ජාතික කෘත්‍රිම සිංචන වැඩසටහන සාර්ථක කර ගැනීමට, කෘත්‍රිම සිංචන උපකරණ බෙදා හැරීමේ කටයුතු ද අඛණ්ඩව පශු වෛද්‍ය කොට්ඨාශ මට්ටමින් සිදු කර ගෙනයනු ලබයි. ඒ සඳහා මෙම වසරේදී කෘත්‍රිම සිංචන උපකරණ මිල දී ගැනීමට රු. මිලියන 11 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, 2025.12.31 වන විට කෘත්‍රිම සිංචන උපකරණ මිල දී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇත. එසේම සමාලෝචිත කාලසීමාව අවසන් වන විට අධි ශීත ගව ශුක්‍ර වඩි සඳහා අවශ්‍ය දියර නයිට්‍රජන් ලීටර 188,546 ප්‍රමාණයක් පළාත් මට්ටමින් බෙදා හැරීම සිදු කර ඇත

ඉදිකිරීම් කටයුතු

සමාලෝචිත කාලසීමාව අවසන් වන විට කුණ්ඩසාලේ හා පොළොන්නරුව කෘත්‍රිම සිංචන මධ්‍යස්ථාන වල ගවගාල්, නිල නිවාස, මාර්ග ගොඩනැගිලි ආදිය අලුත්වැඩියා කිරීම් හා අලුතින් ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන් සිදු කර අවසන් කර ඇත.

පොළොන්නරුව කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානයේ ඉදිකිරීම්, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හා කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානයට අයත් ඉදිකිරීම් කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නාක්ෂණික සේවා නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදුකිරීම සඳහා ඇස්තමේන්තු කිහිපයක්ම සකස් වූ අතර ඒ සඳහා මුදල් වෙන් කිරීම ද සිදුවිය. වසරේ අවසාන කාලය වූ බැවින් 2025.12.31 දින වන විට මෙම කාර්යය සිදුකළ නොහැකි වූ අතර මෙම අළුත්වැඩියාවන්, 2026 වර්ෂයේ සිදු කිරීමට නියමිතය.

සතුන් සඳහා ලැගුම් තටාක ඉදිකිරීම (කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය) සඳහා ටෙන්ඩර් විවෘත කිරීම 2025 දෙසැම්බර් 30 දින සිදුවූ අතර, 2025.12.31 වන විට ටෙන්ඩර් ප්‍රදානය සිදුවී ඇත.

සමාලෝචිත කාලසීමාව අවසන් වන විට කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානයේ කාර්යාලය සහ රසායනාගාරය සඳහා විදුලිය ලබාදෙන විදුලි සැපයුම් අළුත්වැඩියා කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය ලැයිස්තුව මිළදී ගත් අතර, එය 2026 වර්ෂයේ දී සිදුකිරීමට නියමිතය.

අභිජනන ගොවිපොල ලියාපදිංචිය

අංක 59 , 1992 සත්ත්ව රෝග පණතට අනුව සකස් කරන ලද නිර්ණායකයන් පදනම් කොට තෝරා ගත් ගොවිපොල අභිජනන ගොවිපොල ලෙස සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට කටයුතු සලසා ඇත. ඒ සඳහා අවශ්‍ය චක්‍රලේඛ, මාර්ගෝපදේශ සංග්‍රහයන්, ක්‍රියා පටිපාටීන් සකස් කර අවසන් කර ඇත.

ගව, එළු, බැටළු හා සූකර ගොවිපොල මේ යටතේ ලියාපදිංචි කිරීමට නියමිත අතර සත්ත්ව සෞඛ්‍ය අංශයේ නිර්ණායක අනුව රෝග වලින් තොර නිසි පෙව් ආරක්ෂණ ක්‍රමවේද අනුගමනය කරන ගොවිපොල මේ සඳහා ලියාපදිංචි කිරීමට නියමිතය. මෙසේ අභිජනන ගොවිපොල ලෙස ලියාපදිංචි කරන ගොවිපොල වලින් පමණක් සතුන් ක්ෂේත්‍රයට නිකුත් කිරීමට දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේදී කටයුතු කරනු ඇත. 2025.12.31 වනවිට ගව ගොවිපොල 02 ක් හා සූකර ගොවිපොල 04 ක් අධීක්ෂණයට භාජනය කර ඇත.

කිරි ගව රැලේ කාර්ය සාධනය ඇගයීම් වාර්තාව

මෙම ව්‍යාපෘතිය දිවයිනේ උතුරු මැද හා වයඹ පලාත් වල මේ වන විට දියත් කර ඇත. මෙමගින් උසස් ආරයක් සහිත සතුන් තෝරා ව්‍යාපෘතියේ ලියාපදිංචි කරනු ලබයි. ඒ අනුව 2025.12.31 වන විට සතුන් 924 ක් හඳුනාගෙන ලියාපදිංචි කර ඇත. ඔවුන් අතරින් 785 ක් මව් දෙනුන් වේ. දෛනිකව ගොවිපොල හිමිකරුගෙන් ලබා ගන්නා දත්ත අනුව ඉහළ කිරි නිෂ්පාදන විභවතාවයක් සහිත සතුන් හඳුනාගෙන ගොවිපොල හිමියා දැනුවත් කරන අතර හඳුනාගන්නා දුර්වලතා සඳහා අවශ්‍ය පශු වෛද්‍ය සේවය සපයා දෙනු ලබයි. එසේම ආරයෙන් උසස් පිරිමි සතුන් කුණ්ඩසාලේ හා පොළොන්නරුව කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය මඟින් මිල දී ගෙන ගවශුක්‍ර නිපදවීමේ ක්‍රියාවලියට දායක කරගනු ලබයි.

සත්ත්ව ආහාර සංවර්ධන වැඩසටහන

සත්ත්ව ආහාර සම්පත් සංවර්ධන වැඩසටහන යටතේ 2025.12.31 වන විට නව තෘණ හා රනිල ප්‍රභේද වර්ග 03 ක් හඳුන්වා දී ඇත. එනම් *CO-6, Mulato -ii Stylosanthas* වේ. සමාලෝචිත කාලසීමාව අවසන් වන විට මාතෘ තෘණ තවාන් 03 ක් හා ගුණනය කිරීමේ තෘණ තවාන් 41 ක් සංවර්ධනය කර ඇත.

එසේම නව තෘණ ප්‍රභේද පිලිබඳ පූහුණු වැඩසටහන් පවත්වා නිලධාරීන් 789 ක් දැනුවත් කර ඇත. 2025.12.31 වන විට තෘණ ව්‍යවසායකයින් 49 ක් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත. කුණ්ඩසාලේ මධ්‍යම කෘතිම සිංචන මධ්‍යස්ථානයේ අක්කර 02 ක නේපියර් තෘණ වගා භූමියක විසිරි ජල සම්පාදන ක්‍රමයක් ස්ථාපිත කර ඇති අතර අක්කර 02 ක *Mulato -ii* වගාවක් ස්ථාපිත කර ඇත.




6.1.1 තෙලඟැර එළු අභිජනන මධ්‍යස්ථානයේ ව්‍යාප්ත කරන ලද **Stvlosanthes** තෘණ




6.1.2. ඉඹුලන්දණ්ඩ එළු අභිජනන මධ්‍යස්ථානයේ ව්‍යාප්ත කරන ලද **Mulato ii**

ආ. කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම තුළින් තත්ත්වයෙන් උසස් ගව ශුක්‍ර වඩි නිෂ්පාදනය හා බෙදා හැරීම ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය සඳහා රු. මි. 100 වෙන් කර තිබූ අතර, මේ යටතේ පකිස්ථානයෙන් ශුක්‍ර දායක පුංගවයින් ආනයනය කිරීමට රු. මි. 75 ක් වෙන් කරන ලදී. සමාලෝචිත කාල වකවානුව අවසන් වන විට සතුන් තෝරා ගැනීම් කටයුතු අවසන් කර ඇති අතර 2026 පෙබරවාරි මාසයේදී සතුන් ආනයනය සිදුකිරීමට නියමිතව ඇත.




6.2.1 පකිස්ථාන රජයෙන් ආනයනය කිරීමට නියමිත නිලිරවී හා සහිවාල් ශුක්‍ර දායක පුං ගවයින්

එසේම මෙම ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 14.8 ක් වැය කරමින් ආනයනය කිරීමට නියමිත Brazilian Milking Gir අධිශීත ගව ශුක්‍ර වඩි 20000 ක්, ආනයනට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කර තාක්ෂණික කමිටු නිර්දේශය ටෙන්ඩර් අනුමැතිය සඳහා යොමුකර ඇත. එසේම එම ව්‍යාපෘතිය යටතේම රු. මිලියන 10.2 ක් වැය කොට කුණ්ඩසාලේ කෘතිම සිංචන මධ්‍යස්ථානයේ ආරක්ෂිත වැටෙහි වැඩ සම්පූර්ණයෙන් අවසන් කර ඇත.

විශේෂ වැඩසටහන්

ආපදා සහන, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ

2025.12.31 වන විට ආපදාවෙන් හානි නොවූ දකුණු පළාත හැර සෙසු සියළු පළාත්වල දිස්ත්‍රික්ක 21 ක, ගොවිපළ 9622 ක් සඳහා රු.මි. 2200 ක ආපදා සහන දීමනා ගෙවා ඇත.

2.4. පශු සම්පත් සංවර්ධනය උදෙසා 2026 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් සහ ව්‍යාපෘති

2025 වසරේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන් 2026 වසරේදී ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

කිරි ගව ක්ෂේත්‍රය

අ. සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය

කෘත්‍රිම සිංචන මෙහෙයුම් වැඩසටහන යටතේ 2026 වර්ෂය තුලදී කෘත්‍රිම සිංචන 222,932 ක් ද ගැබ් පරීක්ෂා කිරීම් 113,821 ක් සහ පැටවූ උපත් 95,232 ක්ද සිදු කිරීමට බලාපොරොත්තු වේ. කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය මගින් ගව ශුක්‍ර වඩි ගණන 450,000 ක් නිපදවීමට බලාපොරොත්තු වේ. තවද මෙම ව්‍යාපෘතිය යටතේ කෘත්‍රිම සිංචන ශිල්පීන් 200 ක් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට ද නියමිතය.

සත්ත්ව සෞඛ්‍ය වැඩිදියුණු කිරීම

අ. සතුන්ගේ බෝවන රෝග මැඩලීම

ප්‍රතිශක්තිකරණ වැඩසටහන සඳහා අවශ්‍ය වන කුර හා මුඛ, රක්තාශ්‍රව, කාලගාත්‍රා සහ බෘසෙල්ලා එන්නත් පශු පර්යේෂණ ආයතනය මගින් නිෂ්පාදනය කරනු ලබයි. 2026 කාල සීමාව තුළදී ප්‍රතිශක්තිකරණ වැඩසටහන යටතේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිශක්තිකරණ කිරීමට බලාපොරොත්තු වන සතුන් ප්‍රමාණය පහත පරිදි වේ.

එන්නත් වර්ගය	ප්‍රතිශක්තීකරණය කිරීමට බලාපොරොත්තුවන සතුන් ප්‍රමාණය
කුර සහ මුඛ රෝග	1,000,000
කාලගාත්‍රා	81,000
රක්තාශ්‍රව රෝග	225,000
බෘසෙල්ලා	7,500
රැනිකට්	5,000,000

ආ. උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම

පශු පර්යේෂණ ආයතනය මගින් 2026 වසර සඳහා සතුන්ගේ බෝවන රෝග ව්‍යාප්තිය වැළැක්වීම සඳහා පහත අයුරින් එන්නත් නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වේ.

එන්නත් වර්ගය	ප්‍රමාණය
කුර හා මුඛ	500,000
ගව රක්තාශ්‍රව (Alum)	20,000

එන්නත් වර්ගය	ප්‍රමාණය
ගව රක්තාශ්‍රව (Oil adjuent)	125,000
කාලඟාත්‍රා	90,000
බෘසෙල්ලා	10,000
රැනිකට්-I	2,670,000
රැනිකට්-II	2,980,000

ඇ. වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන

වනජීවී රෝග ආවේක්ෂණය දීප ව්‍යාප්තව පුළුල් කිරීම සඳහා පිහිට වූ සම්බන්ධීකරණ ඒකකය වැඩිදියුණු කිරීම, වනජීවී රෝග හඳුනා ගැනීමට අවශ්‍ය පර්යේෂණ කටයුතු පුළුල් කිරීමේ අරමුණින් ජාතික මට්ටමේ සහ ප්‍රාදේශීය මට්ටමේ රසායනාගාර ශක්තිමත් කිරීම සහ වනජීවී රෝග ආවේක්ෂණයට අදාල පරීක්ෂණ කටයුතු සිදු කිරීම හා නිලධාරීන් සහ පාර්ශවකරුවන් සඳහා හැකියා සංවර්ධනය සිදු කිරීමට මෙමඟින් බලාපොරොත්තු වේ.

නීතිමය කටයුතු සහ සේවාවන්

අ. සතුන් හඳුනාගැනීමේ වැඩසටහන

සතුන් හඳුනාගැනීම සහ මධ්‍යම දත්ත සමුදායක් ස්ථාපිත කිරීම උදෙසා 2010 වසරේදී ආරම්භ කළ මෙම වැඩසටහන 2026 වසරේදීද අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ ක්ෂේත්‍ර ව්‍යාප්ති නිලධාරීන් විසින් ලියාපදිංචි කළ ගොවිපොළ නිරීක්ෂණය කරනු ලබන අතර, ඒවායේ සිටින සතුන් 80,000 ක් සඳහා 2025 වසරේදී කන් සලකුණු කිරීමට බලාපොරොත්තු වේ. මෙය සත්ත්ව ගහනය පිළිබඳ නිරවද්‍ය දත්ත පවත්වා ගැනීම, නීති විරෝධී සතුන් ප්‍රවාහනය සහ ඝාතනය වැලැක්වීම, අනාගත කිරි නිෂ්පාදනය පුරෝකථනය සහ ඵලදායී නොවන සතුන් ඉවත් කිරීම යනාදියට උපකාරී වේ.

ආ. සත්ත්ව ගොවිපොළ ලියාපදිංචි කිරීම

සත්ත්ව ගොවිපොළ ලියාපදිංචි කිරීමේ වැඩසටහන 2026 වසරේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත. ගොවිපොළ ලියාපදිංචි කිරීමේ වැඩසටහන සඳහා ප්‍රාදේශීය මට්ටමේ අන්තර්ජාල පාදක දත්ත සමුදායක් නිර්මාණය කෙරේ. 2026 වර්ෂය සඳහා ගොවිපළ 100,000 ක් ලියාපදිංචි කිරීමට ඉලක්ක කර ඇත.

පශු මහජන සෞඛ්‍ය සේවාවන්

අ. සත්ව ආහාර වල ගුණාත්මකභාවය සහතික කිරීම

අපනයන කටයුතු පහසුකරණය සඳහා ආහාරවල ගුණාත්මකභාවය රසායනාගාර පරීක්ෂණ මඟින් තහවුරු කිරීම මෙහි අරමුණ වේ. ප්‍රමිතිගත විශ්ලේෂණ වාර්තා ලබාදීම සඳහා විශ්ලේෂණයන් සිදුකිරීමට අවශ්‍ය සත්ව පෝෂණ පරීක්ෂණාගාරය වැඩිදියුණු කිරීම හා පරීක්ෂණාගාර පහසුකම් වැඩිදියුණු කිරීම අපේක්ෂා කරන අතර දේශීයව සපයා ගත හැකි අමුද්‍රව්‍ය භාවිතයෙන් සත්ත්ව ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමට අදාල පර්යේෂණ කටයුතු සිදු කරයි. 2026 වර්ෂයේදී සත්ත්ව ආහාර සාම්පල 2500 ක ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමට අපේක්ෂා කෙරේ.

2.5. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් 2026 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද නව ව්‍යාපෘති යෝජනා


2025 වසරේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන් හා ව්‍යාපෘති වලට අමතරව පහත සඳහන් නව ව්‍යාපෘති යෝජනා 06 පසුගිය වසරේ ජුනි මස අමාත්‍යාංශය වෙත යොමුකරන ලදී. මෙම ව්‍යාපෘති අතරින් පිළිවෙළින් අංක 1, 3 සහ 5 දරන ව්‍යාපෘති සඳහා 2026 අයවැය මගින් ප්‍රතිපාදන (අරමුදල්) අනුමත විය.

1. පශු සම්පත් අංශයේ සැලසුම්කරණය සහ අධීක්ෂණය සඳහා සහය වීම පිණිස තොරතුරු කළමනාකරණ ඒකකයක් පිහිටුවීම.
2. පරීක්ෂණ සහ ඇගයීම් ඒකකය වැඩිදියුණු කරමින්, පශු සම්පත් ඩිප්ලෝමා සිසුන් සහ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා නිලධාරීන් සඳහා ජාතික මට්ටමේ ඩිජිටල් විභාග ක්‍රමයක් සංවර්ධනය කිරීම.
3. කුණ්ඩසාලේ පිහිටි ශ්‍රී ලංකා සත්ත්ව පාලන විදුහලේ පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම.
4. රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය (PPP) මත පාසල් හරහා සිප්පුකුලම සත්ත්ව පාලන විදුහලේ පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
5. පශු සම්පත් ප්‍රදර්ශන ඒකකයක් සහ පශු සම්පත් නාක්ෂණ උද්‍යානයක් පවත්වාගෙන යාමෙන් දේශීය හා විදේශීය මහජනතාව/අමුත්තන් අතර පශු සම්පත් ප්‍රවර්ධනය කිරීම.
6. පැය 24 පුරා ක්‍රියාත්මක ජංගම විශාල සත්ත්ව ඒකක (Mobile Large Animal Units) පිහිටුවීම සඳහා වන නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සහ 2026 වසරේ සිට ශ්‍රී ලංකාවේ පශු සම්පත් ව්‍යවසායකයින් සඳහා ව්‍යාපාරික ඍයන පැවැත්වීම.

.

3. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය



2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

අ-සෝසිත අවදාන ප්‍රතිපාදන 2025 රු.		සටහන	සමාන 2025 රු.	2024 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඇමුණුම-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර උපකාර		3,350,748,172	1,143,279,000	ඇමුණුම-3
-	සැන්දෑල		33,281,518	59,250,354	ඇමුණුම-4
-	ආයෝජනවල ප්‍රතිලාභ		29,745,282	33,154,677	ඇමුණුම-5
	වෙනත් ක්‍රියාත්මක වෙමින් පවතින ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		3,413,774,971	1,235,684,031	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		3,413,774,971	1,235,684,031	
	භාණ්ඩාගාරයට ලාභාංශ (ඇ)		-	40,000,000	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		3,413,774,971	1,195,684,031	
-	අඩු කළා : වියදම් ප්‍රත්‍යක්ෂගත වියදම්				
709,950,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	709,480,337	612,111,458	
201,500,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	193,564,740	186,093,616	ඇමුණුම-2(i)
26,938,800	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	26,833,677	26,562,542	
-	අතැබූ වෙරිකම්	8	-	-	
-	වෙනත් ප්‍රත්‍යක්ෂගත වියදම්	9	-	-	
938,388,800	මුළු ප්‍රත්‍යක්ෂගත වියදම් (ඊ)		929,858,754	824,767,615	
	මූලධන වියදම්				
44,000,000	මූලධන වත්කම් ප්‍රත්‍යාස්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	22,188,154	17,174,215	
19,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	7,335,664	7,274,914	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-		ඇමුණුම-2(ii)
-	මූලික වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	ඇමුණුම-2(iii)
10,000,000	තැනිකිරා වර්ධනය	14	7,656,086	6,006,893	
2,844,111,200	වෙනත් මූලධන වියදම්	15	2,616,084,579	439,038,642	
2,917,111,200	මුළු මූලධන වියදම් (උ)		2,653,264,484	469,494,664	
	සැන්දෑල වෙනස්		9,233,938	25,376,623	ඇමුණුම-4
	භාණ්ඩාගාර වෙනස්		40,158,182	32,130,378	ඇමුණුම-5
	වෙනත් ක්‍රියාත්මක වෙමින් පවතින වෙනස්		-	-	
	ක්‍රියාත්මක වෙමින් පවතින වියදම් (උආ)		49,392,120	57,507,001	
3,855,500,000	මුළු වියදම් ඌ = (ඊ+උ+උආ)		3,632,515,358	1,351,769,280	
(3,855,500,000)	දෙසැම්බර් 31 දිනට හේතුව උ = (ඉ-ඌ)		(218,740,387)	(156,085,248)	
	අවසර ලැබුනු ප්‍රතිපාදන ඇසුරේ හේතුව		(218,940,387)	(161,329,807)	ඇමුණුම-7
	දෙසැම්බර් 31 දිනට අවසර හේතුව		200,000	5,244,559	ඇමුණුම-3
			(218,740,387)	(156,085,248)	

ඩබ්.එම්.එම්.එම්.පී. හේරත්
ප්‍රධාන ගණකාධිකාරී
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමා
වෙනුවෙන් - පේරාදෙණිය

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	එසේ-6	3,328,838,126	3,259,946,017
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් මිලකම්	එසේ-5/5(අ)	90,017,945	79,605,044
මූදල් හා මූදල් සමාන යු	එසේ-3	-	-
මුළු වත්කම්		3,418,856,071	3,339,551,061
ඉදිරි වත්කම් / බැඳීම්වල			
ගාණ්ඩාගාරය වෙත ඉදිරි වත්කම්		13,569,984	22,160,103
දේපළ පිරියත හා උපකරණ සංචිතය		3,328,838,126	3,259,946,017
කුලී හා වැඩි අත්තිකාරම් සංචිතය	එසේ-5(ඕ)	-	
බැඳීම් වගකීම්			
කෙටිකාලීන මිලකම්	එසේ-4	76,247,961	52,200,382
අයිති ශේෂය	එසේ-3	200,000	5,244,559
මුළු වගකීම්		3,418,856,071	3,339,551,061

මිටු අංක ...07.... සිට ...35... දක්වා එසේ 1 සිට එසේ 7 දක්වා වූ කාණ්ඩ පනවලින් ඉදිරිපත් කොරෙන මිණුම් කොරතුරු සහ ඇමුණුම් මිටු අංක ...36... සිට ...93... දක්වා ඇතුළත් මිණුම් සටහන් වත්කම් ද සමඟ අවසන් මිණුම්කරණ අත්තිකාරම කොටසක් වේ. **2018** මූල්‍ය ප්‍රකාශන සිදුකරල සිටීම රජයේ මූදල් පරිපාලන **150** සහ **151** වන **2025.12.17** දිනැති රාජ්‍ය මිණුම් සංරක්ෂණාගාරීය අංක **02/2025** චක්‍රලේඛනයෙහි අනුකූලව සිදුකර ඇත. ඒ අනුව අවසන් මිණුම්කරණ කලාපයේ සඳහන් කරණය, ඊට අදාළ මිණුම් සටහන් හා අනෙකුත් මිණුම් කොරතුරු ගාණ්ඩාගාර මිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම කරණය සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමි.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය ප්‍රකාශය සඳහා වලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාමේ අයකැමය තුළ පවතින බවත් මූල්‍ය ප්‍රකාශය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ පවලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති වලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වගීව වර කණ්ඩායම්වල සිදුකරන බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණකාධිකාරී නිලධාරි	ගණකාධිකාරී නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මූල්‍ය)/ කොමසාරිස් (මූල්‍ය)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	දිනය :2026.02.18
දිනය :2026.02.23	දිනය :2026.02.19	
	Dr. K.K. Sarath Director General Department of Animal Production and Health Gatambe, Peradeniya.	

02

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2025 රු.	2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්:		
මුළු මිලදී ගැනීම්	-	-
පාරිභෝගිකයන්, අවසානයේ, අවසිතුවේ සහ බලපෑම්	-	-
ලාභාංශ	-	-
අනුගාමී සහායක ලැබීම්	-	-
වෙනත් අනුගාමී කිරීම් වෙනුවෙන් ගෙවූ හෝ ගෙවන ලද අනුගාමී	196,134,926	192,320,817
අලුත් ලැබීම්	3,350,748,172	1,143,279,000	
අත්තිකාරම් අයකර ගැනීම්	24,759,295	91,815,580
සැපයුම්කරුවන් ලැබීම්	33,281,518	59,250,354
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	3,604,923,910	1,426,665,752
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පරිහානි හා මෙහෙයුම් වියදම්	903,025,077	798,205,073
ගබඩාවෙන් සහ මිලදීගැනීම්	26,833,677	26,562,542
මූලධන වෙන්කිරීම් ප්‍රතිලාභයෙන් හා වැඩිදියුණු කිරීම්, මූලධන මාරුකිරීම්, ගැනීම්ය විරිවහන හා වෙනත් මූලධන වියදම්	34,937,932	36,299,471
වෙනත් වැය කිරීම් වෙනුවෙන් දරන ලද වියදම්	4,371,053	32,206,921
සාණ්ඩාගාරයට පියවන ලද අලුත්	3,319,631	40,000,000
අත්තිකාරම් ගෙවීම්	35,260,642	32,022,178
සැපයුම් ගෙවීම්	9,233,936	25,376,623
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (අ)	1,016,981,949	990,672,808
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (අ) =(අ)-(ආ)	2,587,941,961	435,992,944
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්:		
පොළී	-	-
ලාභාංශ	-	-
මිලියකට ඉවත්වීමෙන් ප්‍රතිඵලදාන හා තොගයන විත්තිකම් විකිණීම	-	-
උපාඬය ආපසු ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
තොගයන විත්තිකම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්තිකාරම් ගැනීම්	2,592,986,520	430,748,385
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	2,592,986,520	430,748,385
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(2,592,986,520)	(430,748,385)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(අ) + (ඊ)	(5,044,559)	5,244,559
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්:		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	(5,044,559)	5,244,559
වසරේදී 01 දිනට ආරම්භක මුදල් ශේෂය	5,244,559	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	200,000	5,244,559

ඩබ්.එච්.එම්.එම්.පී. හේරත
ප්‍රධාන ගණකාධිකාරී
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
කැටගම් - පේරාදෙණිය

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය මිණුම් නිර්දේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශනය වෙනිසාගික පිරිවැය මත පිළියෙල කර ඇති අතර කෙසේ වෙතත් තැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉඩදීපත් කර ඇත. අනාගතකරයෙන් දක්වා නොමැති විට මිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව තොකලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) සේවකළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට නිසැකතාවක් ඇති විට හා එම වත්කම විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් සේවකළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

සේවකළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) සේවකළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත මිණුම් සේවකළ, පිරියත හා උපකරණවල අනුරූප මිණුම් වේ.

7) මුදල් හා මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන වූ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

- යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ නතුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකිරීමේ පදනම" යටතේ එම විශේෂිත නතුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.
- නම් වාර්තාකරණ ආයතනයට අදාළ මිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම් යටතේ හෙළිදරව් කළ යුතු ය.

ඩබ්.එම්.එම්.එම්.පී. හේරත්
ප්‍රධාන ගණකාධිකාරි
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණිය

3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ව්‍යවස්ථාපිත සංස්ථාවලින් සපයන ලදි :

ඒකක 22ක ඇතැ :292 ඒකක මට්ටමින් සහ අමාත්‍යාංශය දෙපාර්තමේන්තුව

රු.

ව්‍යාපෘතිය ඇරඹීමේ සිට මෙතෙක් ඇසුරු වැයිසෙවෙන් ඇතැ	වියදම් කර ඇති	ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	සවිමුවින ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මුදල් අමාත්‍යාංශයේ 66/69 මගින් කිරීම (3)	මුළු ඉදිරි ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුළු වියදම (5)	ඉදිරි ප්‍රතිපාදන අවශ්‍යතාව (6)=(4)-(5)
වැඩසටහන (1)	(1) ප්‍රගතිවෙමින	903,000,000	35,500,000	(111,200)	938,388,800	929,858,754	8,530,046
	(2) ඉක්මින	95,000,000	-	-	95,000,000	43,081,384	51,918,616
	උප එකතුව	998,000,000	35,500,000	(111,200)	1,033,388,800	972,940,138	60,448,662
වැඩසටහන (2)	(1) ප්‍රගතිවෙමින	-	-	-	-	-	-
	(2) ඉක්මින	622,000,000	2,200,000,000	111,200	2,822,111,200	2,610,183,099	211,928,101
	උප එකතුව	622,000,000	2,200,000,000	111,200	2,822,111,200	2,610,183,099	211,928,101
	මුළු එකතුව	1,620,000,000	2,235,500,000	-	3,855,500,000	3,583,123,238	272,376,762

.....

මුද්‍රිත මුල් නිලධාරි/ මුද්‍රිත ය ඒකාබද්ධකරු/

අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)

දිනය :2026.02. 16

3.6. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	1,131,509,664.21	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	743,883,655.97	-	-
9153	ඉඩම්	-	1,443,971,105.88	-	-
9155	මූල්‍ය නොවන වෙනත්	-	9,473,700.00	-	-

3.7. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ඩීපීඒ/ශෝධි/සත්/ඩිඑපීඑස/ජනි/2025/26 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2026 මැයි 07 දින

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය
ලැබුණු දිනය
11 MAY 2026
අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්යාලය

ගණන්දීමේ නිලධාරී,

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ශීර්ෂය 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණනාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **නත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන යමහ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2026 මැයි 04 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමහ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් යම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය නත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3. කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තක්සේරුවක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ පරමාර්ථය වේ. යාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමෙදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ

ඒවා දුස්සන්ධානයෙන්, වියාජ ලේඛන සැකසීමෙන්, වෙනහාවිත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථානෝචිතව උචිත විගණන පරීක්ෂාවන් සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණකාධිපතිගේ නිලධාරී දැනුවත් කරමි.

1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූලධන වියදම

ප්‍රාග්ධනීත නොවූ වියදම්

මූලධන වැය යටතේ වැය දරා වැඩ නිම වූ වටිනාකම් රු.1,032,292 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනය තුල වර්ෂයට අදාළව ප්‍රාග්ධනීත කර නොතිබුණි.

1.6.2 වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්

ගිණුම්ගත නොවූ වියදම්

ඉකුත් වර්ෂයේ භාණ්ඩාගාර අර්ථිම මඟින් එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය මඟින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියක් වෙනුවෙන් දරන ලද වැය රු.3,224,079 ක් නොපියවූ අර්ථිම ශේෂයක් ලෙස වරදවා ගිණුම්ගත කර සමාලෝචිත වර්ෂයේදී ඉදිරියට ගෙනවිත් තිබුණි. අදාළ ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී මුදල් ලැබී තිබූ අතර එම මුදල් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි. ඒ අනුව එම වියදම ඉකුත් වර්ෂයේ හෝ සමාලෝචිත වර්ෂයේදී ද වියදම් ලෙස ගිණුම් ගත කිරීම් අත් හැරී තිබුණි.

1.6.3 මූල්‍ය නොවන වත්කම්

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට තක්සේරු කරන ලද එකතු වටිනාකම් රු.297,820,000 ක් වූ ඉඩම් 06 ක් සහ එකතු වටිනාකම් රු.127,810,000 ක් වූ ගොඩනැගිලි 05 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට නිලධාරි නිවාස 126 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2018 දෙසැම්බර් 31 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව රු.5,000 ට වැඩි

වටිනාකම් සහිත වත්කම් ගිණුම්ගත කළ යුතු වුවත් ඉන් බැහැරව එකතු වටිනාකම් රු.381,332 ක් වූ පාරිභෝජ්‍ය දයිතම 520 ක් ඒ ඒ වර්ෂ වලදී වියදම් ලෙස කපා හැර ප්‍රාග්ධනීත කර නිබුණි.

(ඇ) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සතුව පවතින එකතු වටිනාකම් රු.9,473,700 ක් වූ සතුන්ගේ වටිනාකම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය තුළ විකල්පනා ලෙස වරදවා ගිණුම් ගත කර නිබුණි.

1.6.4. ලේඛන පොත්පත් පවත්වාගෙන යාම

විදේශ ගමන් වෙනුවෙන් අදාළ ලියකියවිලි පෞද්ගලික ලිපිගොනු තුළ යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. ඒ සම්බන්ධයෙන් පැවති අභ්‍යන්තර පාලනය දුර්වල මට්ටමක පැවතුණි.

1.6.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

2018 දෙසැම්බර් 31 දිනැති කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය මඟින් නිකුත් කරන ලද මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශයේ 1.1.1 හා 2.3 වගන්ති ප්‍රකාරව වෘත්තීය සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකු මඟින් මූල්‍ය නොවන වත්කම් තක්සේරු කර ගිණුම් ගත කළ යුතු වුවත් එයින් බැහැරව සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම්ගත කර නිබූ එකතුව රු.1,592,466,729 ක් වූ මූල්‍ය නොවන වත්කම් වලට අදාළ තක්සේරු කිරීම් සඳහා වූ සාක්ෂි නොතිබුණි. ඒ අනුව අදාළ වත්කම් ගිණුම් ගත කිරීමේ නිරවද්‍යතාව විගණනයට සතෘප්ත කරගත නොහැකි විය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (ආ)	මූල්‍ය නොවන වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතු බව	1.6.5
2.1.(ආ)	දැස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු බවත්, ඌණ/ අධි ඇස්තමේන්තු නොවිය යුතු බව	3.1.(ඇ)
4.4.(අ)	වත්කම් නිශ්කාර්යය නොකළ යුතු බව	4.2 (ඇ) (ඇ) (ඉ)
3.5	මූල්‍යමය වංචාව සම්බන්ධයෙන් සිදු වූ හානි අයකර ගත යුතු බවත් මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු බව	4.3

ජාතික විගණන කාර්යාලය
NAOSL NATIONAL AUDIT OFFICE

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) මුදල් රෙගුලාසි 128(1)(ඇ) ප්‍රකාරව ප්‍රශ්නූන වර්ෂය සඳහා නියමිත වැඩ සම්පූර්ණ කිරීම ගණන් දීමේ නිලධාරියා විසි වගකීම වූවද එයින් බැහැරව සමාලෝචිත වර්ෂය අවසානයට සංවර්ධන වැඩසටහන් 01 සහ 02 යටතේ ලබා දී තිබූ ශුද්ධ ප්‍රතිපාදන එකතුව රු.717,111,200 කින් ප්‍රතිපාදන උපරිම උපයෝජනය වීම, සියයට 34 සිට සියයට 55 ක් ලෙස එකතුව රු.263,846,717 ක් විය. එමෙන්ම ඉකුත් වර්ෂයේද එම වැඩසටහන්හි ප්‍රතිපාදන උපරිම උපයෝජනය වීම සියයට 49 ත් හා සියයට 27 ත් අතර පැවතුණි.

(ආ) කොළඹ සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථානය පිහිටි ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් ගැටලුවක් තිබීයදී එය නවීකරණය සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.5,000,000 ක ප්‍රතිපාදන වෙන් කරවාගෙන තිබුණද ඉඩම් නිරවුල් නොවීම හේතුවෙන් එයින් රු.4,676,970 ක් හෙවත් එනම් සියයට 93 ක් ප්‍රතිශතයකින් ප්‍රතිපාදන උපරිම උපයෝජනය වී පැවතුණි.

(ඇ) මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව දෙපාර්තමේන්තුව ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී එම ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කළ යුවද, සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත පුනරාවර්තන වැය විෂයයන් 10 ක් සඳහා රු.29,211,200 ක් අධි ඇස්තමේන්තු ද පුනරාවර්තන වැය විෂයයන් 08 ක් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක් සඳහා රු.57,300,449ක් උපරිම ඇස්තමේන්තු කර තිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 66 අනුව පුනරාවර්තන වැය විෂයයන් 04 ක් සහ මූලධන වැය විෂයයන් 04 වෙනුවෙන් පිළිවෙලින් ප්‍රතිපාදන රු.5,000,000 ක් සහ රු.4,303,900 ක් මාරු කර තිබුණු අතර ඉන් සියයට 6 සිට 57 ක් ලෙස ප්‍රතිපාදන රු.2,271,238 ක් හා රු.13,819,020 ක් ඉතිරිවී තිබුණි.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

සමාලෝචිත වර්ෂයේ අවසානය පැවති එකතු වටිනාකම රු.2,736,413 ක් වූ බැඳීම් අවස්ථා 06 ක් බැඳීම් හා බැරකම් ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. එමෙන්ම ගිණුම්ගත නොවූ බැරකම් අවස්ථා 19 ක් සඳහා සමාලෝචිත වර්ෂයට අදාළව රු. 389,549 ක් ගෙවා නිබුණු අතර ගිණුම්ගතවූ බැරකම් වටිනාකම් ඉක්මවා රු.243,958 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති , රීති හා රෙගුලාසිවලට යොමුව		වටිනාකම	අනුකූල නොවීම
		රු.	
(අ)	1986 අංක 15 දරන සත්ත්ව ආහාර පනතේ 6(ආ) සහ 10(ii) වගන්ති	-	රට තුළ පවතින බින්තර, මස්, කිරි නිෂ්පාදනයන්හි ගුණාත්මක භාවය පිරිහීමට හේතුව සත්ත්ව ආහාර වල ගුණාත්මකභාවේ අඩුවක් පවතිනවාද යන්න පරීක්ෂාවට අදාළ නිසි සහයෝගය විගණනයට ලබා

		නොයුන් බැව්ත් පනතේ විධිවිධාන ප්‍රකාර සත්ත්ව ආහාර වල ගුණාත්මක භාවය සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාගේ නිසි වගකීම් ඉටුකළේ ද යන්න විගණනයට යතාර්ථ කරගත නොහැකි විය.නවිද එය පරීක්ෂා කිරීමට අදාළ ව විගණන විෂය පථය ද සීමා කර තිබුණි.
(ආ)	ආයතන සංග්‍රහයේ XV වැනි පරිච්ඡේද	
	3.1 වගන්තිය	පරිවාස කාලයේ ඕටිනා නිලධාරියෙකු අධ්‍යනය හෝ අභ්‍යාස සඳහා විදේශ ගත නොවිය යුතුය යන නියමයෙන් බැහැරව පත්වීම් ලබා මාස 09 ක් පමණක් වූ නිලධාරියෙකු සුහුණු වැඩසටහන් සඳහා විදේශ ගත වී තිබුණි.
(ඇ)	දෙපාර්තමේන්තු චක්‍රලේඛ	
	2025 ජනවාරි 01 දිනැති අංක 09/2024 හා 09/2024(i) දරන චක්‍රලේඛ	ගිණුම්කාරක සහ නිර්දේශ මත සතුන්ට ප්‍රතිකාර කිරීමේ සේවා ආඥා සෑම පළාතකටම පොදු ක්‍රමවේදයකට අනුගත කිරීම වෙනුවෙන් නිකුත් කර තිබූ දෙපාර්තමේන්තු චක්‍රලේඛය ක්‍රියාත්මක වීම පළාත් 07 කට සීමා වී තිබූ අතර බස්නාහිර පළාත හා නැගෙනහිර පළාත තුළ එම චක්‍රලේඛය ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ අනුව අදාළ චක්‍රලේඛ මඟින් අපේක්ෂිත අරමුණට ලඟා වීම සීමා වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1. දැක්ම හා මෙහෙවර

(ඉ) දෙපාර්තමේන්තු ප්‍රධාන මෙහෙවර යටතේ ඇතුළත් සත්ත්ව සෞඛ්‍ය පාලනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුලදී එකතුව රු.374,287,159 ක් වැය දරා තිබුණද එම කාලය තුළ වටිනාකම් රු.16,573,651 ක් වූ ඕද්ධි 782 කට අදාළව සත්ත්ව මරණ වාර්තා වී තිබුණි.

(ආ) 2023 – 2025 දක්වා කාලය තුළ දෙපාර්තමේන්තුවේ ගොවිපළවල මිය ගිය සතුන් 1,968 කින් පියයට 94 – 99 ත් ලෙස සතුන් 1,893 ක් රෝගී ව මිය ගොස් තිබුණි. මෙම තත්ත්වය සත්ත්ව රෝග සම්බන්ධයෙන් විශේෂඥ දැනුම ඇති නිලධාරීන් සිය වගකීමෙන් ඈහැර වීමක් බවත්, තම පාලනයට නතු සතුන් නිරෝගීව පාලනය කර ආරක්ෂා කිරීමට අපොහොසත් වීම රටට සතුන්ගේ රෝග නිවාරණයට දෙපාර්තමේන්තුවේ සාධනීය දායකත්වය කෙරෙහි අහිතකර ලෙස බලපාන බව විගණනයට නිරීක්ෂණය විය.

4.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

අභිජනක අංශය සතුව පවතින ප්‍රධාන අභිජනන මධ්‍යස්ථාන 04 න් මධ්‍යස්ථාන 03 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට මුළු මනින්ම අකර්මණ්‍ය වී තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය තුළදී ඒ වෙනුවෙන් එකතුව රු.14,857,648 වූ රජයේ මුදල් නිශ්කාරියව වැය කර තිබුණි. සෞඛ්‍ය නිර්ණායකයන් වලින් බැහැරව අවිධිමත්ව රෝගී සතුන් ආනයනය කිරීම මෙම මධ්‍යස්ථාන අකර්මණ්‍ය වීමට හේතුවූ බවත් මෙම රෝගී සතුන් පසහරණය වෙනුවෙන් ගත් තීරණ වර්ෂ 1-3 ත් අතර කාල ප්‍රමාදයකින් යුතුව ක්‍රියාත්මක වීම තුළ අදාළ රෝගී සතුන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම්ද ඇතුළු ව එකතුව රු.177,323,517 ක් වූ වැය අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගෙන අරමුණින් බැහැරව වැය දැරීමක් වී තිබුණි. අදාළ මධ්‍යස්ථාන අකර්මණ්‍ය වීම පිළිබඳ විධිමත් පරීක්ෂණ මෙම වාර්තාවේ දිනය දක්වා ආරම්භ කර නොතිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

(අ) වාහන ලේඛනය අනුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ පවතින වාහන 13 ක් දෙපාර්තමේන්තුව වෙත පවරා ගෙන නොතිබුණි.

(ආ) i. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සතුව පවතින අපහරණයට යෝජිත වාහන 16 ක් වර්ෂ 1 ත් 8 ත් අතර කාලයක් අපහරණයට කටයුතු නොකර රජයට අවාසිදායක අයුරින් ගර්හිත කර තිබුණි.

ii. එයින් රු.3,700,000 ක වටිනාකම් වූ වාහන 04 ක් ද ඇතුළුව 2022 වර්ෂය සිට වාහන 05 ක් 2024 කමිටු වාර්තාව අනුව අලුත්වැඩියා කිරීම් හෝ අපහරණය නොකිරීම් හේතුවෙන් 2025 නොවැම්බර් 27 දින දිවවා ගුළි කුණාටුව හේතුවෙන් හානියට පත් වී තිබුණි. 2026 මාර්තු 31 වන විටත් එම වාහන සුරක්ෂිත කිරීම සඳහා උචිත ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

iii. දිවවා ගුළි කුණාටුව හේතුවෙන් ආපදාවට ලක් වූ ධාවන තත්ත්වයේ පැවති වාහන 15 කින් වාහන 13 ක් මාස 04 කට ආසන්න කාලයක් අළුත්වැඩියා අවසන් නොකර

පැවති අතර එම කාල ප්‍රමාදය තුලින් අඳුන්වැඩියා වියදම් අධික වීමක්, වන්කම් උෂ්ණ උපයෝජනය වීමක් මෙන්ම රාජකාරී සඳහා ප්‍රවාහන පහසුකම් යැපයීම සීමා වී තිබුණි.

(ඇ) පෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානයේ අක්කර 37 ක ඉඩමත්, වටිනාකම් රු.3,161,310 ක් වූ නිල නිවාස 02ක් හා 1998 වර්ෂයේ ඉදිකළ වටිනාකම් රු.2,040,000 ක් වූ වරිග අඩි 13,600 ක පැරණි එළු කොටු 5 ක් නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) **JICA goat farming technicaj manual** හි ප්‍රමිතීන්ට අනුව වැඩිහිටි සතෙකුට අවශ්‍ය සෙමෙන ඉඩ ප්‍රමාණය වර්ග මීටර් 2.5-3.0 ක් වන අතර පෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානයේ නව එළු කොටු 04 හි අදාළව උපරිම ධාරිතාවය අඩු වීම නිසාවෙන් එහි නිෂ්කාර්ය වූ ඉඩ ප්‍රමිතිය සියයට 43 සිට සියයට 98 ක් ලෙස පැවතුණි.

(ඉ) හොළොන්නරුව කෘතිම සිංචන මධ්‍යස්ථානයේ පවතින නිල නිවාස 6 ක්, නිෂ්පාදන ගොඩනැගිල්ලක් පැතුලු වන්කම් දයිතම 04 ක් වර්ෂ 02 කට අධික කාලයක් නිෂ්කාර්ය ව පැවතුණි.

4.3 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ හඳුනාගත්

(අ) ගන්නෝරුව පශු පර්යේෂණ ආයතනයේ මුදල් නිලධාරිනිය (ඔරස්) විසින් 2018 සිට 2023 ජූලි මස දක්වා කාලය තුළ දෛනිකව රැස්කරගනු ලබන ආදායමින් රු.14,739,021 ක මුදලක් ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන මුදල් භාරකරු වෙත භාර නොදී පෞද්ගලික පරිහරණයට ලක්කරගෙන අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි. මෙම මූල්‍ය අක්‍රමිකතාවය සම්බන්ධව වූ පාඩුව කලාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි.

4.4 පාඩු හා හානි

(අ) මූ.රෙ.104(4) ප්‍රකාර හානි පාඩු සම්බන්ධයෙන් මාස 03 ක් ඇතුළත සූර්ණ වාර්තා සකස් කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වුවත් මූ.රෙ.106 හා මූ.රෙ.113 යටතේ වන හානි පාඩු සිද්ධි 808 ක එකතුව රු.39,472,425 ක් වර්ෂ 01 ක් 10 ක් දක්වා කාලය තුළ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. එම ශේෂ නිරවුල් කිරීමට විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ආයතනය තුළ ස්ථාපිත වී නොතිබුණි.

(ආ) මනා සැලසුම්කරණයකින් තොරව එන්නත් වඩි නිෂ්පාදනය කිරීම හේතුවෙන් එකතු වටිනාකම රු.3,115,063 ක් වූ **(HS -ALUM)** එන්නත් වඩි 103,718 ක් වර්ෂ 10 කට අධික කාලයක් කල් ඉකුත් වී පැවතුණි. එම හානිය නිරවුල් කිරීමට වර්ෂ 10 කට අධික කාලයක් කටයුතු කර නොතිබුණු අතර වටිනාකම රු.298,821 ක් වූ කල් ඉකුත් වූ එන්නත්සාර වඩි 7,260 ක් කිසිදු ලයකිරීමකින් තොරව රජයට අලාභයක් ලෙස කපා හැර තිබුණි.

(ඇ) දිවිවා ගුළි කුණාටුවෙන් සිදු වූ හානියේ සම්මාලෝචිත වර්ෂය අවසානයට හඳුනාගත් තන්යේරු වටිනාකම් රු.5,385,144 ක් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

4.5 කළමනාකරණ දුර්වලතා

විදේශ ගමන් සඳහා ලයදුම් කළ හැකි තාක්ෂණික ශ්‍රේණියෙහි සමාන තිමිකමක් පවතින නිලධාරීන් **235** ක් සිටියද **2020** සිට **2025** ජූනි දක්වා විදේශ ගමන් වාර **96** ක් සඳහා විධිමත් තාක්ෂණික ඇගයීමකින් හා පෞද්ගලික ලිපිගොනු මගින් පයදුම්පත් කැඳවීමකින් තොරව අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය මත නිලධාරීන් **32** කට පමණක් අවස්ථාව ලබා දී තිබුණි.

මේ අනුව එකම නිලධාරියා අවස්ථා **02** සිට **07** දක්වා වාර ගණනක් විමේදීම හා අනෙකුත් නිලධාරීන් අතර එම අවස්ථා සමානව ලබා නොදීම තුළ දෙපාර්තමේන්තුව වෙත එයින් ලබා ගත හැකි ප්‍රතිලාභ සීමා වී තිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්යය මණ්ඩලය හා තථ්‍ය කාර්යය මණ්ඩලය සැසඳීමේදී සුරජ්පාඩු 216 ක් පැවතුණු අතර තනතුරු 03 ක අතිරික්ත සේවක ප්‍රමාණය 23 ක් වේ.

(ආ) විධායක අනුමත තනතුරු 194 ක් ඇති කිරීමට අදාළ සාධාරණීකරණ වාර්තාව විගණනයට ඉදිරිපත් නොවීම තුළ එම තනතුරු දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට ඵලදායීව යොදවා ගැනීමට ඇති හැකියාව පරීක්ෂාව සඳහා විගණනයට අවස්ථාව නොලැබුණි.

එම්.ජී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

4. කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අනු අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	75%-89%	50%-74%
01	දේශීය කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන/ වසරකට)	✓		
02	වාර්ෂික බිත්තර නිෂ්පාදනය (බිත්තර ගණන/ වසරකට)	✓		
03	වාර්ෂික කුකුළු මස් නිෂ්පාදනය (කි.ග්‍රෑම් වසරකට)	✓		

**පශු වෛද්‍ය කාර්යාල මාසික වාර්තා, කුකුළු අභිජනන මාසික වාර්තා මත පදනම් වූ ඇස්තමේන්තුකළ නිෂ්පාදන දත්ත සහ මහ බැංකු වාර්ෂික වාර්තා මගින් ලබාගත් තොරතුරු මත මෙම ගණනය කර ඇත.*

5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49	50%-74%	75%-100%
(i) සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම	වසර 2025 වන විට දේශීය කිරි නිෂ්පාදනය ලීටර මිලියන 410.16 වෙත ළඟා වීම	දේශීය කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන/ වසරකට)			✓
(ii) සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය හා යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම	වාර්ෂික බිත්තර නිෂ්පාදනය මිලියන 3652.04 වෙත ළඟා වීම	වාර්ෂික බිත්තර නිෂ්පාදනය (බිත්තර ගණන/ වසරකට)			✓
	වාර්ෂික කුකුළු මස් නිෂ්පාදනය 291.17 (000' මෙ.ටො. /වසරකට) වෙත ළඟා වීම	වාර්ෂික කුකුළු මස් (000' මෙ.ටො. /වසරකට)			✓
(iii) ආර්ථික වර්ධන වේගය ඉහළ නැංවීම	කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ සත්ත්ව නිෂ්පාදන අංශයේ වර්ධන වේගය 5% දක්වා ඉහළ නැංවීම	දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය 1% - 1.5% කින් වැඩිවීමේ ප්‍රමාණය		✓	

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

2030 වසර සඳහා වන තිරසාර සංවර්ධන අරමුණු අතරින් අංක 02-සාගින්න මුලිනුපුටා දැමීම සහ අංක 03 - යහපත් සෞඛ්‍යය හා යහපැවැත්ම යන ඉලක්ක සපුරාලීම සඳහා, මස්, කිරි සහ බිත්තර වැනි සත්ත්ව පරිභෝජන ද්‍රව්‍යයන්ගේ සැපයුම් දාමය හරහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සෘජුව හා වක්‍රව දායක වේ.

දේශීය බිත්තර නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කෙටි කාලීන පියවරක් ලෙස 2023 වර්ෂයේ මව් සතුන් ට අමතරව, සංසේචිත බිත්තර ද ආනයනය කෙරිනි. 2025 වර්ෂයේදී බිත්තර නිෂ්පාදනය මිලියන 3652 දක්වා ඉහළ යාමට එම ආනයනය බලපාන ලදී. එය 2024 වර්ෂයට සාපේක්ෂව එය 23% ක ඉහළ යාමකි. නිෂ්පාදනය ඉහළයාමේ ප්‍රතිඵලයක් ලෙස 2025 වර්ෂයේ අවසානය වන විට දේශීය බිත්තරයක වෙළඳපොල සාමාන්‍ය මිල රු. 36.63 ක් විය.

බ්‍රොයිලර් මව් සතුන්ගේ දේශීය නිෂ්පාදනය 2024 වර්ෂයේදී 221,935 ක් වූ අතර එය 2025 වර්ෂයේදී 305,243 ක් දක්වා 37.54% ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කර ඇත. එමෙන්ම 2024 වසරේදී මිලියන 185 ක් වූ බ්‍රොයිලර් සතුන්ගේ දිනක් වයසැති කුකුළු පැටවුන්ගේ නිෂ්පාදනය, 2025 වර්ෂයේදී මිලියන 206 ක් දක්වා 11.35% ක ප්‍රතිශතයකින් ඉහළ ගොස් තිබේ. මේ අනුව 2024 වර්ෂයේදී 258.01 ක් (මෙ.ටො.'000) වූ කුකුළු මස් නිෂ්පාදනය, 2025 වර්ෂයේදී 291.17 (මෙ.ටො.'000) දක්වා ඉහළ ගොස් ඇති අතර එය 12.5% ක ධනාත්මක වර්ධනයකි.

මෙම ක්‍රියාවලිය තුළ වාණිජ මට්ටමින් කුකුළු ආහාර නිෂ්පාදනය ප්‍රමුඛස්ථානයක් ගනී. ඒ අනුව 2024 වර්ෂයේදී 1,187.67 ක් (මෙ.ටො.'000) වූ වාණිජ කුකුළු ආහාර නිෂ්පාදනය, 2025 වසරේදී 1,419.77 ක් (මෙ.ටො.'000) දක්වා ඉහළ ගොස් ඇති අතර එය 19.54% ක සැලකිය යුතු වර්ධනයකි.

කිරි නිෂ්පාදන ක්ෂේත්‍රය පිළිබඳ සැලකීමේදී සමස්ත නිෂ්පාදන ඉලක්ක සපුරාගැනීමට නොහැකි වුවද, 2024 වර්ෂයේදී ලීටර් මිලියන 402.69 ක් වූ දේශීය කිරි නිෂ්පාදනය, 2025 වසරේදී ලීටර් මිලියන 410.16 ක් දක්වා 1.85% ක ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කර ඇත. ආර්ථික අර්බුදය නිසා කර්මාන්තයෙන් ඇත්වූ ගොවීන් නැවත ක්‍රමයෙන් කර්මාන්තය වෙත ළඟාවීමත්, කිරි කර්මාන්තය නඟා සිටුවීමට රජය විසින් ගෙන ඇති යම් යම් ක්‍රියාමාර්ගත් මෙම ක්ෂේත්‍රයේ වර්ධනයට හේතු වී ඇත.

සමස්තයක් ලෙස 2024 වර්ෂයේදී ඒක පුද්ගල කිරි සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන පරිභෝජන සුලභතාවය (ලීටර්) 40.77 ක් වූ අතර, 2025 වර්ෂයේදී එම අගය ලීටර් 47.28 ක් දක්වා ඉහළ ගොස් තිබේ. මීට අනුගාමීව, 2024 වර්ෂයේදී ආනයනය කරන ලද කිරි සහ කිරි නිෂ්පාදන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 67,147.19 ක් වූ අතර, එය 2025 වසරේදී මෙට්‍රික් ටොන් 85,360.25 ක් දක්වා 27.12% ක සැලකිය යුතු ප්‍රතිශතයකින් ඉහළ ගොස් ඇත. මේ අනුව පැහැදිලි වන්නේ, දේශීය කිරි නිෂ්පාදකයින්ට සැපයිය හැකි ප්‍රමාණයට වඩා දේශීය පාරිභෝගික ඉල්ලුම වේගයෙන් වර්ධනය වන බැවින්, එම අවශ්‍යතාවය සපුරාලීම සඳහා විදේශීය වෙළඳපොළ (ආනයන) මත වැඩි වශයෙන් යැපීමට සිදුව ඇති බවයි.

2024 වර්ෂයේ අගෝස්තු මාසය වන විට හදුනාගත් අප්‍රිකානු සූකර උණ වසංගතය හේතුවෙන් දේශීය ඌරු පාලන කර්මාන්තයේ සැලකිය යුතු කඩාවැටීමක් සිදු වූ අතර, එහිදී සතුන් 75,000කට ආසන්න ප්‍රමාණයක් මියයන ලදී. පළාත් කාර්යාල හරහා ලැබුණු පශු වෛද්‍ය කාර්යාල වාර්තාවලට අනුව 2025 වසර පුරාම මෙම රෝගය රට තුළ ව්‍යාප්ත වීම හේතුවෙන් ආසාදිත ගොවිපොළ 75කින් පමණ සතුන් 43,385ක් මියගොස් තිබේ. මෙම රෝගී තත්ත්වයේ සෘජු බලපෑම හේතුවෙන් 2024 වර්ෂයේදී (මෙ.ටො.'000) 8.96ක් ලෙස වාර්තා වූ ඌරු මස් නිෂ්පාදනය, 2025 වසරේදී (මෙ.ටො.'000) 2.97ක් දක්වා 66.85% ක ශීඝ්‍ර පහත වැටීමක් දක්නට ලැබේ.ය

2025 වසරේ අගභාගයේ ශ්‍රී ලංකාවට බලපෑ 'දිට්වා' සුළි කුණාටු ආපදාවෙන් පශු සම්පත් අංශයට, විශේෂයෙන්ම සත්ත්ව ආහාර නිෂ්පාදනාගාර සහ ගොවිපොළ යටිතල පහසුකම්වලට දැඩි හානි සිදුවිය. ගවයන්-40716, ඌරන්-5481, එළුවන්/බැටළුවන්- 12792 සහ කුකුළන්- 889004 ඇතුළු ගොවිපොළ සතුන් විශාල ප්‍රමාණයක් මියගිය අතර, හානියට පත් පශු සම්පත් ගොවීන් නගාසිටුවීම සඳහා රජය විසින් අදාළ මූල්‍ය ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ යටතේ මියගිය සතුන් සඳහා හිමි සහන දීමනා ලෙස රු.මි. 2,200 ක මූල්‍ය වන්දි සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හරහා පළාත් කාර්යාල වලට 2025 දෙසැම්බර් 31 වන විට ගෙවා නිම කළ අතර, එය 2026 වසරේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.

6. මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	194	132	62
තෘතීයික	22	14	08
ද්විතීයික	352	293	59
ප්‍රාථමික	395	300	95

6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධනය පිළිබඳව වගකීම දරණ ප්‍රධාන රජයේ ආයතනය වේ. වර්තමානයේ මෙම දෙපාර්තමේන්තුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

මෙම දෙපාර්තමේන්තුව රට තුළ සත්ත්ව රෝග පැනිරීම වළක්වාලීම, මැඩපැවැත්වීම, පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු, නාක්ෂණික නායකත්වය සැපයීම සහ සත්ත්ව අභිජනන කටයුතු සඳහා විශේෂඥ උපදෙස් හා සහායක සේවාවන් සැපයීම සම්බන්ධව නීත්‍යානුකූල බලය පැවරී ඇති රාජ්‍ය ආයතනයද වේ.

පශු වෛද්‍ය නිලධාරීන් විසින් මෙහෙයවනු ලබන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකකයන්ය. පළාත් නවයේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි පිහිටුවා තිබෙන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල 337 මගින් බිම් මට්ටමේ සියළුම පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

එමෙන්ම මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ප්‍රධානතම නාක්ෂණික නිලධාරී කණ්ඩායම පශු වෛද්‍ය නිලධාරීන් වන අතර ප්‍රධාන කාර්යාලයට හා පළාත් සභාවන්ට අනුයුක්ත පශු වෛද්‍ය නිලධාරීන් අනුමත ප්‍රමාණයට වඩා පුරප්පාඩු පවතින හෙයින් දීප ව්‍යාප්තව මෙන්ම අන්තර් ජාතික වශයෙන්ද පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල සේවාවන් සැපයීමේදී විශාල වශයෙන් ගැටළුකාරී තත්ත්වයන් සඳහා මුහුණපෑමට සිදු වේ. තවද විශ්ව විද්‍යාල මඟින් පශු වෛද්‍ය උපාධිය සම්පූර්ණ කර පිටතට පැමිණෙන පශු වෛද්‍යවරුන් රාජ්‍ය සේවයට බඳවා ගැනීමට උත්සාහ කළද ලැබෙන වැටුප, දුෂ්කර රාජකාරීන් සිදු කිරීමට ඇති අකමැත්ත,ආකර්ශනයේ අඩුකම සහ අනෙකුත් පර්යේෂණාගාර හා රසායනාගාරවල හිඟකම් වැනි පහසුකම් වල ගැටළුද හේතුවෙන් මේ සඳහා ඇතුලත් වීමට නවක නිලධාරීන් මැලිකමක් දැක්වීම මෙම නිලධාරී හිඟයට ප්‍රධාන හේතුවක් වී ඇත.

තවද මෙම දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන සත්ත්ව පාලන විද්‍යාල මඟින් සත්ත්ව පාලන ඩිප්ලෝමාව හදාරා අවසන් වන සිසුන් මෙම දෙපාර්තමේන්තුවේ පශු සම්පත් සංවර්ධන නිලධාරී සහ පළාත් සභා වල සත්ත්ව සංවර්ධන උපදේශක යන තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කල හැකි නමුත් රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත මේ වන විට රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සීමාකර ඇති හෙයින් එම නාක්ෂණික තනතුරු වලද පුරප්පාඩු බහුලව පවතී. එමෙන්ම දුෂ්කර සේවයේ රාජකාරී ඉටුකිරීමේදී සහාය කටයුතු සඳහා අවශ්‍ය රියදුරන් මෙන්ම ලිපිලේඛන රාජකාරී කටයුතු සඳහා කාර්යාලගතව රාජකාරී ඉටුකරනු ලබන කළමනාකරණ සේවා නිලධාරීන්ද පුරප්පාඩු පවතී.

ඒ අනුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අරමුණු හා වාර්ෂික ඉලක්ක කරා ලඟාවීමේදී උක්ත නිලධාරී හිඟය බොහෝ අවස්ථාවලදී සීමාකාරී සාධකයක් බවට පත්විය.

නව රජයේ ප්‍රතිපත්ති වලට අදාලව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කාර්යයන් පුළුල් වීමත් සමඟ නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් ප්‍රකාරව මෙම දෙපාර්තමේන්තුව සඳහා ප්‍රසම්පාදන ඒකකයක් පිහිටුවීමට කටයුතු කරන ලද අතර ඒ සඳහා අභ්‍යන්තරව අංශ වල සේවය කරන ලද කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කිරීමට සිදුවිය. එනම් දෙපාර්තමේන්තුවේ අනෙකුත් අභ්‍යන්තර අංශය වල සේවය කරන ලද සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සේවා නිලධාරීන් අනුයුක්ත කරන ලදී. ඒ අනුව අනෙකුත් අංශ වල රාජකාරී ඉටුකිරීමේදී යම් යම් දුෂ්කරතා ඇති වී ඇත.

තවද රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කල නිලධාරී කමිටුවේ අංක PMO/RRPCM/2025/decision හා 2025.11.12 දිනැති ලිපිය මඟින් පුරප්පාඩු වී ඇති පහත තනතුරු සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇත.

- නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ තනතුරු 08
- පශු විමර්ශන නිලධාරී තනතුරු 06
- පශු පර්යේෂණ නිලධාරී තනතුරු 17
- පර්යේෂණ නිලධාරී තනතුරු 03
- සත්ත්ව පාලන නිලධාරී තනතුරු 10
- පශු වෛද්‍ය නිලධාරී තනතුරු 11
- නීති නිලධාරී තනතුරු 01
- පර්යේෂණ සහකාර තනතුරු 11
- නීති සහකාර තනතුරු 01
- තාක්ෂණ නිලධාරී (සිවිල්) තනතුරු 03
- තාක්ෂණ නිලධාරී (යාන්ත්‍රික) තනතුරු 01
- පශු සම්පත් සංවර්ධන නිලධාරී තනතුරු 29
- නේවාසිකාගාර පාලක තනතුරු 01
- නේවාසිකගාර පාලිකා තනතුරු 01
- රසායනාගාර සහායක තනතුරු 20

ඒ අනුව උක්ත සඳහන් තනතුරු පුරප්පාඩු (123) සඳහා බඳවා ගැනීමට අදාල මූලික කටයුතු ආරම්භ කරන ලදී.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	ඉලක්කගත කණ්ඩායම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබාගත් දැනුම
පශු වෛද්‍යවරුන් සඳහා සීමාවාසික පුහුණුව	පශු වෛද්‍යවරුන්	36	දින 19	දේශීය	හඳුන්වාදීමේ පුහුණුව
අලි ඇතුන් නිර්වින්දනය කිරීම	එම	17	දින 02	දේශීය	අලි ඇතුන් නිර්වින්දනය කිරීම පිළිබඳ අවබෝධය
නායකත්වය	එම	23	දින 02	දේශීය	රාජ්‍ය සේවය සඳහා අවශ්‍ය නායකත්වය පිළිබඳ අවබෝධය
මරණ පරීක්ෂණ හා පශ්චාත් මරණ පරීක්ෂණ පුහුණුව	එම	17	දින 02	දේශීය	කුකුළු මස් අපනයනය කිරීම පිළිබඳ පශු වෛද්‍යවරුන් දැනුවත් කිරීම
ප්‍රසම්පාදනය සහ ලංසු ඇගයීම	එම	40	දින 02	දේශීය	ප්‍රසම්පාදනය හා ලංසු ඇගයීම පිළිබඳ අවබෝධය
කළමනාකරණ පුහුණුව	එම	38	දින 05	දේශීය	නායකත්වය හා කාර්යාල කළමනාකරණය පිළිබඳ අවබෝධය
ආයතන සංග්‍රහය සහ මූදල් රෙගුලාසි පුහුණුව (සිංහල මාධ්‍ය)	එම	14	දින 03	දේශීය	ආයතන සංග්‍රහය හා මූදල් රෙගුලාසි පිළිබඳ අවබෝධය
ආයතන සංග්‍රහය සහ මූදල් රෙගුලාසි පුහුණුව (දෙමළ මාධ්‍ය) - අන්තර්ජාලය ඔස්සේ	එම	19	දින 06	දේශීය	ආයතන සංග්‍රහය හා මූදල් රෙගුලාසි පිළිබඳ අවබෝධය
සමාජ ආචාර විධි	එම	27	දින 01	දේශීය	විෂයානුබද්ධ ආචාර ධර්ම පිළිබඳ අවබෝධය
ආකනි කළමනාකරණය	එම	29	දින 01	දේශීය	ආකනි කළමනාකරණය පිළිබඳ අවබෝධය
ප්‍රතිජීවක ප්‍රතිරෝධිතාව	එම	48	දින 02	දේශීය	ප්‍රතිජීවක ප්‍රතිරෝධිතාව පිළිබඳ අවබෝධය
සත්ව බෝකිරීම	එම	11	දින 03	දේශීය	කිරි ගව පාලනයේදී සිදුවිය හැකි ප්‍රජනක ගැටලු පිළිබඳ අවබෝධය
නීති හා අණ පනත් පුහුණුව	එම	24	දින 03	දේශීය	දෙපාර්තමේන්තුවේ නීති හා අණ පනත් පිළිබඳ අවබෝධය
එළු පාලන පුහුණුව	එම			දේශීය	නවීන එළු පාලනය පිළිබඳ අවබෝධය
දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන ගොවිතැන	TOT	29	දින 01	දේශීය	පරිසර හිතකාමී ලෙස ගොවිපල නඩත්තු කිරීම

වැඩසටහනේ නම	ඉලක්කගත කණ්ඩායම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබාගත් දැනුම
හඬ පුහුණුව	පශු වෛද්‍යවරුන්, සත්ව පාලන නිලධාරී, සත්ව සංවර්ධන උපදේශක ,පශු සම්පත් සංවර්ධන නිලධාරීන්,සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන්,	28	දින 01	දේශීය	ප්‍රාදේශීය වශයෙන් මාධ්‍ය කණ්ඩායමක් ස්ථාපිත කිරීම
වැටුප් සකස් කිරීම, සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ ගෙවීම්, වාහන අලුත්වැඩියාව හා විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම	පශු සම්පත් සංවර්ධන නිලධාරීන්,සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන්, පර්යේෂණ සහකාර	70	දින 02	දේශීය	වැටුප් සකස් කිරීම, වාහන අලුත්වැඩියාව හා විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම පිළිබඳ අවබෝධය
මයික්‍රොසොෆ්ට් එක්සෙල්	එම	20	දින 02	දේශීය	Microsoft Excel භාවිතා කිරීම පිළිබඳ අවබෝධය
පවර්පොයින්ට්, එක්සෙල් සහ අන්තර්ජාලය	එම	80	දින 02	දේශීය	අන්තර්ජාලය සහ ඊමේල් භාවිතය පිළිබඳ අවබෝධය
ආතනි කළමනාකරණය	එම	83	දින 01	දේශීය	ආතනි කළමනාකරණය පිළිබඳ අවබෝධය
ප්‍රසම්පාදන පුහුණුව	එම	87	දින 01	දේශීය	ප්‍රසම්පාදනය පිළිබඳ අවබෝධය
මයික්‍රොසොෆ්ට් වර්ඩ මූලික	එම	12	දින 02	දේශීය	Microsoft Office භාවිතය පිළිබඳ අවබෝධය
මයික්‍රොසොෆ්ට් වර්ඩ මූලික	එම	12	දින 02	දේශීය	Microsoft Office භාවිතය පිළිබඳ අවබෝධය
කණ්ඩායම් ගොඩනැගීම	සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන්, පර්යේෂණ සහකාර	46	දින 01	දේශීය	කණ්ඩායම් ගොඩනැගීම පිළිබඳ අවබෝධය

වැඩසටහනේ නම	ඉලක්කගත කණ්ඩායම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබාගත් දැනුම
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන	එම	25	දින 01	දේශීය	පාරිභෝගික අධිකාරී පනත දෛනික කටයුතුවලදී යොදා ගැනීම පිළිබඳ අවබෝධය
සනීපාරක්ෂක කිරි නිෂ්පාදනය	පශු සම්පත් සංවර්ධන නිලධාරීන්, සත්ව සංවර්ධන උපදේශක	52	දින 02	දේශීය	කිරිවල ගුණාත්මක භාවය වැඩි කිරීම පිළිබඳ අවබෝධය
එලිසා පරීක්ෂණ	පර්යේෂණ සහකාර	37	දින 01	දේශීය	ELISA testing පිළිබඳ අවබෝධය
ක්ෂුද්‍රජීව විද්‍යාව සහ ELISA පරීක්ෂණ	පර්යේෂණ සහකාර	37	දින 01	දේශීය	ක්ෂුද්‍රජීව විද්‍යාව සහ ELISA පරීක්ෂණ පිළිබඳ අවබෝධය
කාර්යාල උපකරණ ක්‍රියාත්මක කිරීම	කාර්යාල කාර්ය සහායක	15	දින 01	දේශීය	කාර්යාල උපකරණ භාවිතය පිළිබඳ අවබෝධය
රසායනාගාර ආරක්ෂාව හා හොඳ පිළිවෙත්	ක්ෂේත්‍ර සහායක, රසායනාගාර සහායක	33	දින 02	දේශීය	රසායනාගාර ආරක්ෂාව හා හොඳ පිළිවෙත් පිළිබඳ අවබෝධය
ආයතන සංග්‍රහය	ක්ෂේත්‍ර සහායක, රසායනාගාර සහායක	60	දින 01	දේශීය	ආයතන සංග්‍රහය පිළිබඳ අවබෝධය
කණ්ඩායම් ගොඩනැගීම සහ අභිප්‍රේරණය	රියදුරන්, කාර්යාල කාර්ය සහායක, ක්ෂේත්‍ර සහායක, රසායනාගාර සහායක	44	දින 01	දේශීය	කණ්ඩායම් ගොඩනැගීම හා අභිප්‍රේරණය පිළිබඳ අවබෝධය
වාහන නඩත්තුව සහ ආරක්ෂිත මාර්ග භාවිතය	රියදුරන්	30	දින 01	දේශීය	වාහන නඩත්තුව හා ආරක්ෂාකාරීව මාර්ග භාවිතා කිරීම පිළිබඳ අවබෝධය

7. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්(වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	මුදල් රෙගුලාසි ප්‍රකාර මෙම දෙපාර්තමේන්තුවට මෙම ගිණුම් සැකසීම අවශ්‍ය නොවේ	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කිරීම අවශ්‍ය නොවේ.	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්			
2	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම(මූ.රෙ. 445)**	අනුකූල වේ		
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව,රජයේ පඩිපන් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූලවේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මූ.රෙ.134(2) DMA 1-2019 අනුව,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම			
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	අංශවලින් පිළිතුරු ලබාදීමට කාලයක් ගැනීම	සිහිකැඳවීම් යවමින් පසු විපරම් කිරීම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017දරණ වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.4	වාර්ෂික භාන්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට නිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදුකිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06ට වඩා අඩු කාලයකදී අපහරණය කර නිබීම	අනුකූල නොවේ	2024 වර්ෂයේදී අපහරණය කළ යුතු වාහන හඳුනා ගැනීමේ කමිටුව මඟින් ලබා දී ඇති නිර්දේශ පැහැදිලි නොමැති වීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති අතර නැවත අපහරණය කළ යුතු වාහන හඳුනා ගැනීමේ කමිටුවක් පත් කර ඉදිරි කටයුතු සිදු කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්දන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම	තාවකාලිකව අත්හිටුවා ඇත.	වාහන නඩත්තුකිරීම් සම්බන්ධ රා.ප.ව. 30/2016 ප්‍රකාරව සිදු කප යුතු නමුත් මේ වන විට පාලනය කළ ඉන්ධන කෝටාවන් නිකුත් කරන හෙයින් ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීම ප්‍රායෝගික නොවී ඇත.	
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන නිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මූදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මූ.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම්**			
13.1	කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මූ.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මූ.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	මුදල් රෙගුලාසි ප්‍රකාරව අදායම් ගණන්දීමේ නිලධාරියා නොවන බැවින්	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	විශේෂ හේතු මත ස්ථාන මාරු වීම් ලබා දීමේදී හා තාවකාලික අනුයුක්ත කිරීම් වලදී කාර්ය මණ්ඩලය ඉක්මවා යාම් සිදු වී ඇත. නවද රාජ්‍ය සේවායේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය තාවකාලිකව අත්හිටුවීම මත අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් පුරප්පාඩු පවතී	ඉදිරියේදී නියමිත ස්ථාන මාරු පටිපාටි ක්‍රමවේද නිසි ආකාරයෙන් පිලිපැදීම තුලින් වලක්වා ගැනීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීමේ අග්‍රාමාත්‍ය අනු කමිටුව මඟින් බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇති තනතුරු සඳහා බඳවා ගැනීම් 2026 වර්ෂයේදී සිදු කිරීම මඟින් යම්තාක් දුරකට පුරප්පාඩු සම්පූර්ණ කල හැකිය.
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී නිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පලකිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදන කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම් 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ නහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම් 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නිබීම			
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කොට නිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කොට නිබීම	අනුකූල වේ		